NEOS CORPORATE නියම හා කොන්දේසි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය, ලියාපදිංචි අංකය PQ 27

වෙත: නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
අංක 40, නවම් මාවත,
කොළඹ 02

දිනය: ....

.... හි පදිංචි .... (**"ගනුදෙනුකරු"**) වන අප විසින් පහත දැක්වෙන Neos Corporate නියම හා කොන්දේසි මත සහ ඒවාට යටත්ව (මෙහි මින්මතු **" Neos Corporate"** යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික බැංකු සේවාව භාවිත කිරීමට අවසර ලබා දෙන මෙන් (මෙහි මින්මතු "**බැංකුව**" යනුවෙන් සඳහන් කරනු ලබන) නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුවෙන් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ;

1. අර්ථනිරූපන:-

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන තාක්දුරට හැර, මෙම නියම හා කොන්දේසිවල;

(අ) **"ගිණුම් මැන්ඩේට් පත්‍රය"** යන්නෙන්, මැන්ඩේට් ආකෘති පත්‍රය සහ ගිණුමට අදාළ වෙනත් නියම හා කොන්දේසි අදහස් වේ.

(ආ) **"ගිණුම/ගිණුම්"** යන්නෙන්, මෙම නියම හා කොන්දේසි අදාළ විය යුතු Neos Corporate මාර්ගගත බැංකු යෙදුමෙහි ලැයිස්තුගත කරන ලද හෝ බැංකුව සහ ගනුදෙනුකරු අතර අන්‍යාකාරයකින් ලිඛිතව එකඟ වූ ගිණුම/ගිණුම් අදහස් වේ.

(ඇ) **"නිවේදනය"** යන්නෙන්, බැංකුව විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හෝ ආකෘතියකින් පද්ධතිය හරහා හෝ අන්‍යාකාරයකින් බැංකුව විසින් ගනුදෙනුකරුවන් හෝ යම් බලයලත් පරිශීලකයකු වෙත ලබාදෙන පහසුකමක්/පහසුකම් සහ/හෝ සේවාවක් සම්බන්ධයෙන් වන යම් නිවේදනයක්, තහවුරු කිරීමක්, උපදෙසක් හෝ වෙනත් සම්ප්‍රේෂණය කිරීමක් අදහස් වේ.

(ඇ) **"අයදුම්පත්‍රය"** යන්නෙන්, මෙම නියම හා කොන්දේසි සමග Neos Corporate මාර්ගගත බැංකු සේවා යෙදුම සඳහා වන අයදුම්පත්‍රය අදහස් වේ.

(ඉ) **"බලයලත් පරිශීලකයන්"** යන්නෙන්, පද්ධතිය වෙත ප්‍රවේශවීම සඳහා සහ පද්ධතිය භාවිත කිරීම සඳහා ගනුදෙනුකරු විසින් බලය ලබා දී ඇති සහ ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ලබා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් මගින් පත්කරනු ලබන ගනුදෙනුකරුගේ යම් සේවකයන් අදහස් වේ.

(ඊ) **"බැංකුව"** යනනෙන්, ශ්‍රී ලංකාවේ නීති යටතේ යථාපරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන සහ අංක 40, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනයෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් වේ.

(උ) **"අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය"** යන්නෙන් Neos Corporate මාර්ගගත බැංකු සේවාවන් ලබාගැනීමේ කාර්යය සඳහා ගනුදෙනුකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යථාපරිදි සම්මත කරනු ලබන යෝජනා සම්මතය/ යෝජනා සම්මත අදහස් වේ.

(ඌ) **"නම් කළ උපකරණය"** යන්නෙන්, ගනුදෙනුකරු විසින් Neos Corporate මාර්ගගත බැංකුසේවා කටයුතුවල නිරතවීමේදී භාවිත කළ හැකි අන්තර්ජාල පහසුකම සහිත ගනුදෙනුකරුගේ එම කටයුතුවලට ගැලපෙන ඉලෙක්ට්‍රොනික උපාංග සහ ආශ්‍රිත උපකරණ අදහස් වේ.

(එ) **"විධාන"** යන්නට, කවර ස්ථානයක හෝ අධිකරණ බලප්‍රදේශයක යම් නඩුවක දී (නීතියේ බලය තිබුණ ද, නොතිබුණද, නමුත් නීතියේ බලය නොමැති වුවහොත්, විධානය අදාල කිරීමට අදහස් කරනුයේ යම් තැනැත්තන් හෝ අස්ථිත්වයන් වෙත ද, එම තැනැත්තන්ගේ හෝ අස්ථිත්වයන්ගේ සාමාන්‍ය භාවිතය ප්‍රකාරව විධානයන්ට අනුකූලව කටයුතු කරන්නේ නම් පමණක්) යම් නියෝජ්‍යායතනයක, යම් රාජ්‍යයක හෝ යම් ස්වයං නියාමන සංවිධානයක යම් විධානයක්, නියෝගයක්, ඉල්ලීමක්, නියමයක්, රීතියක්, සීමාකිරීමේ වැඩසටහනක්, ප්‍රතිපත්තියක්, මාර්ගෝපදේශයක් හෝ දැන්වීමක් ඇතුළත් වේ.

(ඒ) **"පහසුකම්"** යන්නෙන්, පාර්ශ්වයන් විසින් එකග වී ඇති නියම හා කොන්දේසි ("පහසුකම් පිළිබඳ ගිවිසුම") මත කලින් කල බැංකුව විසින් ගනුදෙනුකරු වෙත සපයනු ලබන බැංකු සේවා පහසුකම්, බහුකාර්ය බැංකු සේවා පහසුකම්, බහුකාර්ය වෙළඳ පහසුකම් සහ වෙළඳ පහසුකම් අදහස් වේ.

(ඔ) **"මූල්‍ය තොරතුරු"** යන්නෙන්, බැංකුව හෝ තුන්වන පාර්ශ්ව විසින් පද්ධතිය හරහා ගනුදෙනුකරු වෙත සන්නිවේදනය කරනු ලබන ගනුදෙනුකරුගේ ගිණුම්වලට අදාළ නොවන තොරතුරු අදහස් වේ.

(ඕ) **"සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි"** යන්නෙන්, බැංකුව විසින් කලින් කල තීරණය කරනු ලබන සහ බැංකුව විසින් දීර්ඝ කරන ලද සේවාවන්ට අදාළ වන සාමාන්‍ය ව්‍යාපාර නියම හා කොන්දේසි අදහස් වේ.

(ක) **"උපදෙස්"** යන්නෙන්, යම් ගිණුමක් හෝ ගිණුම් සහ/හෝ සේවාවක් සම්බන්ධයෙන්, මෙම නියම හා කොන්දේසිවලට අනුකූලව සහ කලින් කලට බැංකුව සහ ගනුදෙනුකරු විසින් එකඟ වන්නා වූ යම් ආකාරයකින් හෝ ආකෘතියකින් පද්ධතිය හරහා හෝ අන්‍යාකාරයකින් බැංකුව වෙත ලබාදෙන යම් උපදෙස්, දත්ත හෝ වෙනත් සම්ප්‍රේෂණ අදහස් වේ.

(ග) **"බුද්ධිමය දේපළ අයිතිය"** යන්නෙන්, යම් ප්‍රකාශන අයිතියක්, පේටන්ට් බලපත්‍රයක්, (ලියාපදිංචි කළ හෝ නොකළ) වෙළඳ ලකුණක්, සේවා ලකුණක්, වෙළඳ හෝ ව්‍යාපාර නාමයක්, දත්ත සමුදා අයිතියක්, (ලියාපදිංචි කළ හෝ නොකළ) සැලසුම් නිර්මාණ අයිතියක්, පරිගණක මෘදුකාංග භාවිත කිරීමේ අයිතිය, භූ ලක්ෂණ අයිතිය, වෙළඳ රහස් සහ ලොව ඕනෑම ස්ථානයක පවතින ඒ හා සමාන වෙනත් සියලු අයිතීන් අදහස් වේ.

(ච) **"අන්තර්ජාලය"** යන්නෙන්, සම්ප්‍රේෂණ පාලන ප්‍රොටෝකෝලය සහ අන්තර්ජාල ප්‍රොටෝකෝලය හරහා ලොව වටා පරිගණක සම්බන්ධ කරන්නා වූ එකිනෙකට සම්බන්ධිත ජාල පද්ධතියක් අදහස් වේ.

(ජ) **"නීතිය"** යන්නට, කවර ස්ථානයක හෝ අධිකරණ බලප්‍රදේශයක යම් නඩුවක දී වර්තමානයේ හෝ අනාගතයේ පවත්නා යම් පොදු හෝ චාරිත්‍රානුකූල නීතිය සහ යම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, ආඥාවක්, නඩු තීන්දුවක්, නීතියක්, නියමයක්, ආඥාපනතක්, නියෝගයක්, ව්‍යවස්ථාවක්, ගිවිසුමක් හෝ වෙනත් ව්‍යවස්ථාපිත නියමයක් ඇතුළත් වේ.

(ට) **"පාඩු"** යන්නෙන්, (සම්පූර්ණයෙන් හානිපූරණය කිරීමේ පදනම මත පිරිවැය සහ නීති ගාස්තු කළමනාකරණය කිරීම ඇතුළුව) සියලු පාඩු, අලාභ, හානි, දඩ, පිරිවැය සහ සෘජු, ආනුශංගික සහ විශේෂ අලාභ, ලාභ අහිමිවීම, අපේක්ෂිත ඉතිරිකිරීම් අහිමිවීම හෝ අඩුවීම, පොළිය අහිමිවීම, කීර්තිනාමය අහිමිවීම සහ දත්ත නැතිවීම ඇතුළු වියදම් අදහස් වේ.

(ඩ) **"Neos Corporate"** යන්නෙන්, අන්තර්ජාලය පදනම් කරගත් බැංකුවේ Neos Corporate සේවාව අදහස් වේ.

(ණ) **"OTP"** යන්නෙන්, පද්ධතියට අදාළ පෞද්ගලික හඳුනාගැනීමේ කේතයක් අදහස් වේ.

(ත) **"ප්‍රතිපූරණය කළ හැකි මුදල්"** යන්නෙන්:-

(i) භාණ්ඩ හා සේවා බදු, එකතු කළ අගය මත බදු සහ සමාන බලපෑමක් සහිතව අයකරනු ලබන වෙනත් බදු, අයබදු සහ තීරුබදු;

(ii) බැංකුව වෙත උපචිත වන කොමිස් මුදල්, තැපැල් සහ බෙදාහැරීමේ පිරිවැය, වියදම් ගෙවීම්, වියදම්, මුද්දර ගාස්තු සහ වෙනත් අයකිරීම්;

(iii) බැංකුව වෙත උපචිත වන යම් බැරකම්; සහ

(iv) පද්ධතිය, සේවාවන් සම්බන්ධයෙන් සහ/හෝ සේවා මට්ටම් ප්‍රමිතීන්, පරිශීලක මාර්ගෝපදේශය සහ/හෝ ගිණුම් මැන්ඩේට්පත්‍ර සමග මෙම නියම හා කොන්දේසි යටතේ හෝ ඒවාට සම්බන්ධව ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු යම් මුදලක්;

අදහස් වේ.

(ද) **"සේවාවන්"** යන්නෙන්, බැංකුව විසින් ගනුදෙනුකරු වෙත කලින් කල සපයනු ලබන්නා වූ පද්ධතිය සහ (ගනුදෙනු උත්පාදනය කිරීමේ මෙවලම්, පුහුණුවීම් සහ සහාය සේවා ආදී) සම්බන්ධිත සේවාවන් භාවිත කරනු ලබන යම් ඉලෙක්ට්‍රොනික මූල්‍ය සේවාවන් අදහස් වේ.

(න) **"සේවා මට්ටම් ප්‍රමිතීන්"** යන්නෙන්, බැංකුව විසින් ස්වකීය වෙබ් අඩවියෙහි කලින් කල යාවත්කාලීන කරනු ලැබිය හැකි සහ සලස්වනු ලැබිය හැකි යම් සේවාවන් සම්බන්ධයෙන් තත්කාලය සඳහා අදාල විය හැකි සේවාවන්ට අදාල තොරතුරු සහ ගාස්තු අදහස් වේ.

(ප) **"මෘදුකාංග ටෝකන්පත"** යන්නෙන්, Google LLC විසින් ලබාදෙන Google Play Store සහ App Store හරහා ලබාගත හැකි Google සත්‍යාපනය කිරීමේ යෙදුම (Google authenticator) අදහස් වේ.

(බ) **"පද්ධතිය"** යන්නෙන්, පරිශීලක මාර්ගෝපදේශයෙහි වැඩිදුරටත් විශේෂයෙන් විස්තර කර ඇති Neos Corporate යනුවෙන් නම් කර ඇති ආයතනික **මාර්ගගත** බැංකු සේවා වේදිකාව අදහස් වේ.

(ම) **"පද්ධති බිඳවැටීම"** යන්නෙන්, පද්ධතියට බලපාන්නා වූ යම් දෝෂයක්, ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමක් හෝ වෙනත් අදාල අවස්ථානුගත කරුණක් අදහස් වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පද්ධතිය හරහා යම් උපදෙස් හෝ නිවේදන යැවීමට හෝ ලබා ගැනීමට ගනුදෙනුකරුට හෝ බැංකුවට නොහැකි වේ.

(ය) **"නියම හා කොන්දේසි"** යන්නෙන්, මෙහි අන්තර්ගත Neos Corporate නියම සහ කොන්දේසි සහ කලින් කල සංශෝධනය කිරීම, පරිපූරණය කිරීම, අලුත් කිරීම, නැවත ප්‍රකාශ කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කළ හැකි එම Neos Corporate නියම හා කොන්දේසි සහ යම් ලේඛනයක් මගින් එම ලේඛනයේ නියම ප්‍රකාරව නියම හා කොන්දේසි සංශෝධනය කිරීම, පරිපූරණය කිරීම, අලුත් කිරීම, නැවත ප්‍රකාශ කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම සිදු කරන්නේ ද, එවැනි යම් ලේඛනයක් අදහස් වේ.

(අඅ) **"පුහුණුව"** යන්නෙන්, බැංකුවේ නියෝජිතයන් විසින් පවත්වනු ලබන පුහුණුකිරීම් අදහස් වන අතර, එම පුහුණු කිරීම් ගනුදෙනුකරුගේ ලියාපදිංචි කාර්යාලයේ හෝ ගනුදෙනුකරු විසින් නම් කළ වෙනත් යම් ස්ථානයක හෝ වාස්තවිකව පැවැත්විය හැකි ය.

(ආආ) **"UB යතුර"** යන්නෙන් පද්ධතියට අදාළ ගනුදෙනු සත්‍යාපනය කිරීමේ කාර්යය සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන, පරිගණක චිපයක් අන්තර්ගත ප්ලාස්ටික් හෝ වෙනත් ආරක්ෂක යතුරක්/ටෝකනයක් අදහස් වේ.

(ඇඇ) **"පරිශීලක මාර්ගෝපදේශය"** යන්නෙන්, කලින් කල සංශෝධනය කරනු ලබන පරිදි පද්ධතියට අදාලව බැංකුව විසින් හෝ බැංකුව සඳහා ගනුදෙනුකරු වෙත ලබාදෙන්නාවූ ලිඛිත සහ මාර්ගගත මාර්ගෝපදේශය සහ වෙනත් උපදෙස් අදහස් වේ.

(ඈඈ) **"වැඩකරන දිනය"** යන්නෙන්, ගිණුමක් ඇති, සෑම බලප්‍රදේශයකම ව්‍යාපාර කටයුතු සඳහා වාණිජ බැංකු විවෘතව පවතින්නේ යම් දිනයක දී ද, එවැනි දිනයක් අදහස් වේ. (නමුත් සෙනසුරාදා සහ ඉරිදා බැහැර කළ යුතු ය.)

2. පද්ධතිය භාවිත කිරීමේ අයිතිය සහ බුද්ධිමය දේපළ අයිතීන්

2.1 භාවිත කිරීමේ අයිතිය සඳහා වන ගාස්තුව : ගනුදෙනුකරු විසින් 3.1 වන වගන්තියේ දක්වා ඇති ගාස්තුවක් (පද්ධතිය භාවිත කිරීමේ අයිතිය සඳහා වන ගාස්තුව) ගෙවීම් සැලකිල්ලට ගනිමින් සේවා මට්ටම් ප්‍රමිතීන් සහ පරිශීලක මාර්ගෝපදේශය සමග මෙම

නියම හා කොන්දේසිවලට අනුකූලව පද්ධතිය සහ පරිශීලක මාර්ගෝපදේශය භාවිත කිරීමේ අනන්‍ය නොවන අයිතියක් බැංකුව විසින් ගනුදෙනුකරු වෙත ප්‍රදානය කරනු ලබයි.

2.2 පද්ධතිය සම්බන්ධයෙන් වන හිමිකම : පද්ධතියේදී, පරිශීලක මාර්ගෝපදේශයේ දී හෝ අදාළ ලේඛනවල කිසිදු හිමිකමක් හෝ හිමිකාරිත්ව අයිතියක් හෝ බුද්ධිමය දේපල අයිතියක් ගනුදෙනුකරු වෙත ප්‍රදානය කිරීම හෝ ගනුදෙනුකරු විසින් අත්පත් කර ගැනීම හෝ නොකළ යුතු ය.

2.3 පද්ධතිය අනවසරයෙන් භාවිත නොකිරීම : මෙම නියම හා කොන්දේසි, පරිශීලක මාර්ගෝපදේශය සහ යම් සේවා ගිවිසුම් අනුකූලව හැර, පද්ධතිය, පරිශීලක මාර්ගෝපදේශය හෝ පද්ධතියේ භාවිත කර ඇති සියලු වගු, රූපසටහන්, වගුසටහන්, දත්ත පුස්තකාල, ආකෘති, පූර්ව ආකෘති/ආදේශ, භාණ්ඩ ආදර්ශ, ආදායක පුස්තකාල, ආදාන ආකෘති, අපනයන ආකෘති, පැතුරුම්පත් තිර ආකෘති, මුද්‍රණ අක්ෂරමය සැකසුම්, ප්‍රදර්ශක පිරිසැලසුම් සහ නිරූපක නිර්මාණ ඇතුළුව පද්ධතියේ හෝ පරිශීලක මාර්ගෝපදේශයේ යම් අංගයක් සහ සියලු මූල්‍ය තොරතුරු වාර්තා, දත්ත තොරතුරු වාර්තා, ගෙවීම් සහ එකතු කිරීමේ වාර්තා, ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ වර්තා සහ නිදහස් ආකෘති පණිවුඩ පිටපත් කිරීම හෝ අන්‍යාකාරයෙන් භාවිත කිරීම ගනුදෙනුකරු විසින් සිදු නොකරන බවටත්, එසේම ගනුදෙනුකරු විසින් ඔහුගේ සේවා නියුක්තයන්, බලයලත් භාවිතකරන්නන්, අනුයෝජිතයන් සහ/හෝ වෙනත් තෙවන පාර්ශ්වයන් විසින් එසේ සිදු නොකිරීමට සලස්වන බවටත් ගනුදෙනුකරු විසින් එකඟව සිටී.

2.4 බැංකුවේ වෙළඳ ලකුණු : ගනුදෙනුකරු විසින් බැංකුවේ පූර්ව ලිඛිත අවසරයෙන් තොරව, කිසිදු කාර්යයක් සඳහා "NDB බැංකුව", "Neos Corporate" යන වෙළඳ ලකුණු හෝ බැංකුව විසින් හෝ එහි අදාල යම් සමාගමක් විසින් සේවාවන් සහ/හෝ පද්ධතිය සම්බන්ධයෙන් භාවිත කළ හැකි හෝ භාවිත කිරීමට යෝජනා කර ඇති ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කර නොමැති වෙනත් යම් වෙළඳ ලකුණක් හෝ ව්‍යාකූල කළ හැකි තරමට සමාන යම් වෙළඳ ලකුණක් හෝ ලාංඡනයක් භාවිත නොකළ යුතු ය.

2.5 බලපත්‍ර හෝ උපබලපත්‍ර ලබා නොදීම : ගනුදෙනුකරු විසින් පද්ධතිය සහ සේවාවන් ඔහුගේම ව්‍යාපාර කටයුතු සඳහා පමණක්ම භාවිත කළ යුතු අතර පද්ධතිය, සේවාවන්, පරිශීලක මාර්ගෝපදේශය පිළිබඳ බලපත්‍රය හෝ උපබලපත්‍රය තෙවන පාර්ශ්වයනට ලබාදීම හෝ පද්ධතියේ බැංකුව සතු බුද්ධිමය දේපල අයිතීන්ට (හෝ බැංකුව වෙත බුද්ධිමය දේපළ අයිතීන් හටගනුයේ යම් තැනැත්තකු හරහා ද, එවැනි යම් තැනැත්තකුගේ බුද්ධිමය දේපල අයිතීන්ට) අගතිදායක අයුරින් යම් දෙයක් කිරීම සිදු නොකළ යුතු ය.

2.6 සීමා කළ බෙදා හැරීම : ගනුදෙනුකරු විසින් පද්ධතිය, සේවාවන්, පරිශීලක මාර්ගෝපදේශය හෝ පද්ධතිය හරහා සන්නිවේදනය කරන ලද දත්ත සහ/හෝ තොරතුරු බලයලත් පරිශීලකයන් හැර යම් තැනැත්තකුට බෙදා හැරීම හෝ එවැනි තැනැත්තකුට සැලසීම නොකළ යුතු ය.

2.7 ප්‍රකාශන හිමිකම් නිවේදනය : බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් ගනුදෙනුකරුට ලබාදෙන ලද යම් ප්‍රකාශන හිමිකම් දැන්වීමක් හෝ වෙනත් හිමිකාරීත්ව හෝ සීමාකාරී දැන්වීමක් හෝ යම් ලේඛනයක අන්තර්ගත හෝ ඇතුළත් වන යම් සටහනක් හෝ එහි යම් පිටපතක් ගනුදෙනුකරු විසින් ඉවත් කිරීම, වෙනස් කිරීම, නිශ්ප්‍රභ කිරීම හෝ අන්‍යාකාරයෙන් අනවසර වෙනස් කම් කිරීම සිදු නොකළ යුතු ය.

2.8 රජයේ සහ නියාමන බලපත්‍ර; අවසරපත්‍ර සහ අනුමතයන් : තොරතුරු ක්ෂේත්‍රගත කිරීම සහ විනිමය පාලනය සම්බන්ධයෙන් වන සියලු අදාළ නීති සහ විධාන ඇතුළත් වන නමුත් ඒවාට සීමා නොවන පද්ධතිය සහ සේවාවන්ට අදාළ සියලු අදාළ නීති සහ විධාන යටතේ නියමිත සියලු අදාළ රජයේ, නියාමන සහ වෙනත් අදාළ වන බලපත්‍ර, අවසරපත්‍ර සහ අනුමතයන් ගනුදෙනුකරු විසින් ලබාගෙන පවත්වාගෙන යා යුතු ය.

3. ගාස්තු

3.1 **පද්ධතිය භාවිතකිරීමේ අයිතිය සඳහා වන ගාස්තුව :** මෙම නියම හා කොන්දේසිවල 2 වන වගන්තියේ සඳහන් පද්ධතිය භාවිත කිරීමේ අයිතිය (පද්ධතිය භාවිත කිරීමේ අයිතිය සහ බුද්ධිමය දේපළ අයිතීන්) මෙම නියම හා කොන්දේසිවල සඳහන් කර ඇති පරිදි ගනුදෙනුකරු විසින් බැංකුව ගෙවිය යුතු මාසික කුලියකට යටත්ව වේ.

3.2 **සේවා සහ ගනුදෙනු සම්බන්ධයෙන් වන ගාස්තු :** බැංකුව විසින් සේවාවන් සහ වෙනත් ගනුදෙනුවලට අදාළව කලින් කල පනවනු ලබන සේවා මට්ටම් ප්‍රමිතීන්ට අනුකූලව එම සේවාවන් සහ ගනුදෙනු සඳහා ගාස්තු සහ වෙනත් අය කිරීම් ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවනු ලැබිය යුතු ය. දැනුම්දීමක් සිදුකර යම් සේවා සහ ගනුදෙනු සම්බන්ධයෙන් වන ගාස්තුවක් වැඩි කිරීම හෝ වෙනස් කිරීම බැංකුවේ අභිමතය පරිදි කළ හැකි අතර එම දැන්වීම බැංකුවේ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබිය යුතුය.

3.3 රඳවා ගැනීම් සහ විකුණුම් බදු වල ශුද්ධ ගාස්තු : මෙම නියම හා කොන්දේසි සහ සේවා මට්ටම් ප්‍රමිතීන් සහ ගිණුම් මැන්ඩේට් පත්‍ර යටතේ ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු සියලු ගාස්තු, අයකිරීම් සහ වෙනත් මුදල් යම් බදු ඇතුළුව යම් ආකාරයේ අඩු කිරීම් හෝ රඳවා ගැනීම්වල ශුද්ධ අගය විය යුතු අතර යම් සේවා බදු ද (උදාහරණයක් ලෙස එකතු

කළ අගය මත බද්ධ හෝ භාණ්ඩ හා සේවා බද්ධ) ඉවත්ව විය යුතු ය. එම ගාස්තු, අය කිරීම් සහ වෙනත් මුදල් අදාළ වන අවස්ථාවලදී, අදාළ ව්‍යවස්ථා යටතේ නියම කරනු ලබන පරිදි ගෙවීම සිදුකිරීමට ඇති අවස්ථාවේදී බලාත්මකව පවතින අනුප්‍රමාණයකට ගනුදෙනුකරුගෙන් අයකරගත යුතු අතර ගනුදෙනුකරු විසින් ගෙවනු ලැබිය යුතු ය. ගනුදෙනුකරු විසින් මෙම නියමය යටතේ ගෙවන ලද හෝ ගෙවිය යුතු හෝ ගනුදෙනුකරුගෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලකින් ඕනෑම අවස්ථාවකදී ගනුදෙනුකරු හෝ යම් වෙනත් තැනැත්තකු යම් මුදලක් අඩු කළහොත් හෝ රඳවාගතහොත්, එම අඩු කිරීම හෝ රඳවා ගැනීම අවශ්‍ය නොවන හෝ සිදුකර නොමැති අවස්ථාවකදී බැංකුවට ලබාගත හැකිව තිබූ සහ එසේ රඳවාගත හැකි වූ මුදලට සමාන මුදලක් බැංකුවට ලැබෙන බවට සහ බැංකුව රඳවා ගන්නා බවට (එහි සම්පූර්ණ ශුද්ධ ආදායම මත වන බදු හැර යම් බැරකම් වලින් නිදහස්ව) සහතික කිරීම සඳහා අවශ්‍ය යම් අමතර මුදලක් එම අවස්ථාවේදීම ගනුදෙනුකරු විසින් ගෙවනු ලැබිය යුතු ය.

3.4 ගිණුම හර කිරීම සහ හිලව් කිරීම :

3.4.1 ගනුදෙනුකරුගෙන් බැංකුවට ලැබිය යුතු සියලු සහ යම් ණය හිඟ සහ ගෙවිය යුතු වුවද, නොවූවද එමෙන්ම අවිනිශ්චිත වුවද නොවුව ද ගනුදෙනුකරු වෙත බැංකුවට හිමි යම් ණයවලින් හිඟ සහ ගෙවිය යුතු වුවද නොවුවද, එම ණය නම් කරන ලද මුදල් ඒකකය නොසලකා කලින් කල, ගනුදෙනුකරුට දැනුම් දීමෙන් තොරව සෑම අවස්ථාවකදීම හිලව් කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුවට, බැංකුවේ නියෝජිත බැංකුවලට සහ අනුයෝජිතයන්ට අවලංගු කළ නොහැකි ලෙස බලය ලබා දෙනු ලැබේ. මේ වගන්තිය යටතේ බැංකුව සතු අයිතිවාසිකම් වෙනත් යම් නියම හා කොන්දේසි යටතේ හෝ අන්‍යාකාරයෙන් බැංකුව සතු විය හැකි යම් වෙනත් අයිතිවාසිකම්වලට අමතරව සහ ඒවායේ වටිනාකම හීන නොකරන ආකාරයට විය යුතුය.

3.4.2 Neos Corporate භාවිත කිරීම සම්බන්ධයෙන් බැංකුවේ වෙබ් අඩවියෙහි පල කරනු ලබන යම් වර්ගයක ගාස්තු (3.1), සේවා සහ ගනුදෙනු සම්බන්ධයෙන් වන ගාස්තු (3.2) ගනුදෙනුකරුගේ ගිණුමෙන්/ ගිණුම්වලින් හර කිරීම සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව වෙත බලය දෙනු ලැබේ.

4. බාරදීම සහ ස්ථාපනය කිරීම

පද්ධතිය භාරදීමට පෙර, ගනුදෙනුකරු විසින් අවශ්‍ය බලයලත් පරිශීලකයන් පිළිබඳ සහ බලය ලබා දෙන්නා හඳුනාගැනීම පිළිබඳ විස්තර ඇතුළත් කළ ඉල්ලුම් පත්‍රයක් බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. බැංකුව විසින් ගනුදෙනුකරු වෙත පද්ධතිය සහ පරිශීලක මාර්ගෝපදේශය භාරදීම හෝ භාරදීමට සැලැස්වීම කරනු ලැබිය යුතු ය. ගනුදෙනුකරු විසින්

Neos Corporate URL ලිපිනය ගනුදෙනුකරුගේ නම් කළ උපකරණයේ ප්‍රියතමයක (favorite) ආකෘතියෙන් හෝ මුල් පිටුවක් (home page) ලෙස ශේෂණය කළ යුතුය.

5. පුහුණුව සහ සහාය

ගනුදෙනුකරු සහ බැංකුව අතර එකඟ වූ යම් නියම හා කොන්දේසි මත බැංකුව විසින් බලයලත් පරිශීලකයන් සඳහා වන පුහුණුව වාස්තවිකව හෝ බැංකුව සහ ගනුදෙනුකරු අන්‍යෝන්‍ය වශයෙන් තීරණය කරන ලද ස්ථානයකදී ලබා දිය යුතුය.

6. **පෞද්ගලික දත්ත**

බැංකුව හෝ එහි යම් සේවකයෙකු විසින් පද්ධතිය, සේවා සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයෙන් වුවද පෞද්ගලික දත්ත භාවිත කිරීමකට හෝ ගැලපීම සඳහා සහ පෞද්ගලික දත්ත ජාත්‍යන්තරව හුවමාරු කිරීම සඳහා ගනුදෙනුකරු විසින් සියලු අදාල බලයලත් පරිශීලකයන්, ගෙවීම් ලබන්නන්, වෙනත් තුන්වන පාර්ශ්ව, රජයේ නියෝජිතායතන සහ නියාමන අධිකාරීන් වෙතින් යම් නීතියක් හෝ විධානයක් මගින් නියම කර ඇති අවස්ථාවකදී ලිඛිත කැමැත්ත සහ වෙනත් අවශ්‍ය සියලු අනුමතයන්, බලපත්‍ර සහ අවසර පත්‍ර ලබා ගත යුතු ය. (එමෙන්ම පවත්වාගෙන යා යුතු ය.) ඉල්ලා සිටින අවස්ථාවක දී, බැංකුවට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි එම කැමැත්ත ලබාදීම්, අනුමතයන්, බලපත්‍ර සහ අවසර පත්‍රවල මුල් ලේඛන, පිටපත් හෝ වෙනත් සාක්ෂි ගනුදෙනුකරු විසින් බැංකුවට ලබා දිය යුතුය.

7. ආරක්ෂක යුතුකම

7.1 Corporate මඟින් පරිශීලක අනන්‍යතාවය / අනන්‍යතාවයන් ඉල්ලා සිටිනු ලබන සෑම පරිශීලකයකු/පරිශීලකයන් වෙත එම පරිශීලක අනන්‍යතාවය /අනන්‍යතාවයන් බැංකුව විසින් නිර්මාණය කරනු ලැබිය යුතුය. පරිශීලක අනන්‍යතාවය /අනන්‍යතාවයන් Neos Corporate යෙදුමෙහි සඳහන් පරිශීලකයාගේ /පරිශීලකයන්ගේ විද්‍යුත් තැපැල් ලිපිනයට/ලිපිනයන්ට විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් යැවිය යුතුය. ස්ථාන මාරුවීම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් මත යම් පරිශීලකයකුගේ / පරිශීලකයන්ගේ පරිශීලක ප්‍රවේශය ඉවත් කරනු ලබන අවස්ථාවකදී ඒ පිළිබඳව බැංකුව වෙත පූර්ව දැනුම් දීමක් කිරීම ආයතනික ගනුදෙනුකරුගේ වගකීම විය යුතුය.

7.2 ගනුදෙනුකරුගේ ආරක්ෂක බැඳියාවන් : ගනුදෙනුකරු විසින්, පද්ධතිය, නම් කළ උපකරණය පරිශීලක අනන්‍යතාවය, මුරපදය සහ පරිශීලක මාර්ගෝපදේශය සොරකම් කිරීමෙන් හෝ බලයලත් පරිශීලකයන් හැර වෙනත් තැනැත්තන් විසින් පරිශීලනය කිරීමෙන් ආරක්ෂා කරගැනීමට සුදුසු ආරක්ෂණ පියවර ගැනීම සඳහා සහ 6 වන වගන්තියට

(පෞද්ගලික දත්ත) අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සඳහා එකඟ විය යුතු අතර ඊට අමතරව ගනුදෙනුකරු විසින් සේවා මට්ටම් ප්‍රමිතීන්, පරිශීලක මාර්ගෝපදේශය සමඟ මෙම නියම හා කොන්දේසිවල ආරක්ෂණ විධිවිධානවලට අනුකූලව සහ බැංකුව විසින් කලින් කල ගනුදෙනුකරු වෙත ලිඛිතව නිවේදනය කරනු ලබන ආකාරයට කටයුතු කරනු ලැබිය යුතුය.

7.3 ගනුදෙනුකරුගේ ආරක්ෂක බැඳියාවන් සඳහා පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ:

7.3.1 සියලු UB යතුරු නිකුත් කිරීමෙන් පසුව ආරක්ෂිතව තබා ගන්නා බවට ගනුදෙනුකරු සහතික විය යුතුය;

7.3.2 සෑම බලයලත් පරිශීලකයෙකුටම UB යතුරක් නිකුත් කර නොමැති බවටත්, ඒ අනුව UB යතුරු බලයලත් පරිශීලකයන්ට පමණක් නිකුත් කරනු ලබන බවටත් ගනුදෙනුකරු සහතික විය යුතුය

7.3.3 එක් එක් තාවකාලික මුරපදය, එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපදය (OTP) සහ අවසර ලබා දීමේ මුරපදය ගනුදෙනුකරුගේ බලයලත් පරිශීලකයා පමණක් දන්නා බවටත්, ඒවා යම් ලිඛිත ආකාරයකින් පවත්වාගෙන නොයන බවටත් ගනුදෙනුකරු සහතික විය යුතුය;

7.3.4 බලයලත් පරිශීලකයන් වෙත නිකුත් කර ඇති UB යතුරුවල ආරක්ෂාව සහ පද්ධතියට ප්‍රවේශ වීම සඳහා ඔවුන් විසින් භාවිත කරනු ලබන තාවකාලික මුර පදයෙහි, එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදයෙහි (OTP) ආරක්ෂාව සහතික කිරීම සඳහා වන සියලු ආරක්ෂණ පියවර බලයලත් පරිශීලකයන් විසින් ගනු ලබන බවට ගනුදෙනුකරු සහතික විය යුතුය;

7.3.5 නම් කළ උපකරණය සුදුසු ආරක්ෂිත පරිසරයක පවත්වාගෙන යන බවටත්, එයට සාමාන්‍ය මහජනතාවට ප්‍රවේශ විය නොහැකි බවටත්, නැතහොත් පොදු ප්‍රදේශයක නොමැති බවටත් ගනුදෙනුකරු සහතික විය යුතු ය; සහ

7.3.6 නම්කළ උපකරණය : ගනුදෙනුකරු විසින් Neos Corporate භාවිත කිරීම සඳහා යොදාගන්නා නම් කළ උපකරණය නිසි පරිදි ක්‍රියාකරන තත්ත්වයෙන් සපයාගෙන පවත්වාගෙන යාමට සහ නම් කළ උපකරණයට හෝ Neos Corporate වෙත ඇතිවිය හැකි හානිකර තර්ජනවලට එරෙහි ප්‍රමාණවත් ආරක්ෂණ විධිවිධාන සහිතව සපයාගෙන පවත්වාගෙන යාමට වගකිව යුතු අතර Neos Corporate වෙත

දෝෂ සහිත හෝ අනාරක්ෂිත උපකරණයක් භාවිතයෙන් ප්‍රවේශ වීම හෝ Neos Corporate වෙත හානිදායක අයුරින් බලපෑ හැකි යම් ආකාරයකින් ප්‍රවේශවීම නොකළ යුතු ය.

7.3.7 මුරපදය වෙනස් කිරීම : ගනුදෙනුකරුට හෝ බලයලත් පරිශීලකයන්ට, නියෝජිතයන්ට සහ/හෝ ගනුදෙනුකරු විසින් යථා පරිදි බලය ලබාදෙන ලද වෙනත් තුන්වන පාර්ශ්වයන්ට පවරන ලද මුර පදය Neos Corporate වෙත පළමුවරට ප්‍රවේශවීමෙන් ඉක්බිතිවම සහ ඉන්පසු දින අනූවක (90) කාලසීමාවක් ගතවීමෙන් පසු ක්‍රමවත් කාල පරතරයන්හිදී මාරු කිරීමට ඇති වගකීම ගනුදෙනුකරු විසින් පිළිගත යුතු ය.

7.4 ආරක්ෂාව කඩකිරීම : පහත දැක්වෙන අවස්ථාවන් විශ්වාස කිරීමට ගනුදෙනුකරුට යම් පදනම් පවතී නම්, ගනුදෙනුකරු විසින් ඒ පිළිබඳව වහාම දුරකතනයෙන් බැංකුවට දැනුම් දිය යුතු අතර පසුව ඒ සම්බන්ධයෙන් විද්‍යුත් තැපැල් පණිවුඩයක් හෝ ලියාපදිංචි කරන ලද ආවරණයක් යටතේ ලිපියක් යවනු ලැබිය යුතු ය:-

7.4.1 පද්ධතිය, UB යතුර, තාවකාලික මුරපදය, එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදය (OTP) හෝ වෙනත් සත්‍යයනය කිරීමේ කාර්ය පටිපාටියක් අනතුරට භාජනය වී, අනවසරයෙන් වෙනස් කර, සොරකම් කර, නැති වී හෝ අවභාවිතා කර ඇති හෝ එසේ කර තිබිය හැකි වීම හෝ ඒ පිළිබඳව දැනුම අදාළ අවසරලත් පරිශීලකයා හෝ බැංකුවේ බලයලත් සේවා නියුක්තකයන් හැර යම් තැනැත්තකු විසින් අත්පත් කරගෙන ඇති හෝ අත්පත් කරගෙන තිබිය හැකි වීම; යම් උපදෙස් හෝ මූල්‍ය තොරතුරක් හෝ උපදෙසක් අනුව කිරීමට ඇති යම් ගෙවීමක් ලැබීමට යම් නොහැකියාවක් තිබීම හෝ ලැබීමේ යම් ප්‍රමාදයක් තිබීම; හෝ යම් මූල්‍ය තොරතුරු, ගිණුමක් සම්බන්ධයෙන් වන උපදෙසකට හෝ ගෙවීමකට අදාළ තොරතුරු යැවීමේදී හෝ ලැබීමේ දී යම් දන්නා හෝ සැක කරනු ලබන දෝෂයක් හෝ වංචාවක් හෝ බලපෑමක් තිබීම හෝ යම් උපදෙසක යම් ක්‍රමලේඛනමය දෝෂයක් හෝ අඩුපාඩුවක් හෝ දූෂණයක් තිබීම හෝ මෙම නියම හා කොන්දේසිවල යම් ආරක්ෂක විධිවිධානයක් කඩ කිරීමක් හෝ කඩකිරීමේ හැකියාවක් පැවතීම.

7.4.2 ඉහත 7.2.1 වන වගන්තියෙහි සඳහන් යම් සිදුවීමක් සිදුවීමෙන් පසුව ප්‍රතිකර්මය පියවර පැනවීමේදී බැංකුවේ උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට ගනුදෙනුකරු විසින් තම උපරිම උත්සාහය දැරිය යුතු අතර අවශ්‍ය නම්, නම් කළ උපකරණය ඇති ස්ථානයට ප්‍රවේශවීම සඳහා බැංකුවේ සේවානියුක්තයන්, නම් කළ නියෝජිතයින්

සහ උප ගිවිසුම්කරුවන් වෙත ඉඩ ලබාදිය යුතු ය. UB යතුරු හෝ තාවකාලික මුරපදයක්, එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදය (OTP) සම්බන්ධ වෙමින් ආරක්ෂාව කඩවීමක් පිළිබඳව දැන ගැනීමට ලැබීමෙන් ඉක්බිතිවම ගනුදෙනුකරු විසින් එම UB යතුර, තාවකාලික මුරපදය හෝ එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුර පදය (OTP) පද්ධතියෙන් මකා දැමිය යුතු අතර ඒ පිළිබඳව නිසි නිවේදනය ලැබීමෙන් පසුව එම UB යතුර, තාවකාලික මුරපදය හෝ එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපදය (OTP) මගින් පද්ධතියට ප්‍රවේශ විය නොහැකි වන බව සහතික කිරීම සඳහා බැංකුව විසින් අවශ්‍ය සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය. එම ආරක්ෂාව කඩවීමෙන් උපචිත වූ හෝ එම කඩවීමට සම්බන්ධව නැති වූ හෝ හිමිකම්පානු ලබන යම් මුදලක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකියනු ලැබිය යුතුය.

7.5 පරිශීලක මාර්ගෝපදේශය : සියලු බලයලත් පරිශීලකයන් මෙහි ආරක්ෂණ විධිවිධාන ඇතුළුව නමුත් ඒවාට සීමා නොවන මෙම නියම හා කොන්දේසි සහ පරිශීලක මාර්ගෝපදේශය නැවත පරීක්ෂා කර, අවබෝධ කරගෙන, ඒවාට අනුකූලව කටයුතු කරන බවට ගනුදෙනුකරු විසින් සහතික විය යුතුය.

7.6 වෛරස මගින් දූෂණය වීම: ගනුදෙනුකරු විසින් නම් කළ උපකරණ වෛරස් දූෂණයන්ගෙන් සහ වෙනත් විනාශකාරී උපාංග සහ කේතයන්ගෙන් තොරවන බවටත්, පද්ධතියට හෝ බැංකුවේ පරිගණක උපකරණයකට, දෘඩාංගයකට හෝ මෘදුකාංගයකට වෛරසයක් සම්ප්‍රේෂණය නොකරන බවටත් සහතික කිරීමට තම උපරිම උත්සාහය ගනු ලැබිය යුතුය.

8. බලය ලබාදීම සහ උපදෙස් ක්‍රියාත්මක කිරීම

8.1 සාමාන්‍ය උපදෙස් :

8.1.1 පද්ධතිය විසින් යම් උපදෙසක් ලැබුණු බව පිළිගනු ලබන අවස්ථාවකදී පමණක් එම උපදෙස ලැබී ඇති බවට බැංකුව විසින් සලකනු ලැබිය යුතු ය. කෙසේ වෙතත්, මෙම වගන්තියෙහි සඳහන් කිසිවකින් 8.7 වන වගන්තිය යටතේ උපදෙස් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් වන බැංකුව සතු අභිමතයට (උපදෙස් ක්‍රියාවට නැංවීමට පොහොසත් වීම) බලපෑම් නොකරයි; සහ

8.1.2 උපදෙස්වල අව්‍යාජ බව සහ නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා බැංකු විසින් කලින් කළ නියම කරනු ලබන යම් දේවල් ගනුදෙනුකරු විසින් කළ යුතු අතර එසේ බැංකුව විසින් නියම කරන යම් ලේඛන සහ/හෝ තොරතුරු බැංකුව වෙත සපයනු ලැබිය යුතු ය.

8.2 පද්ධතිය බිඳවැටීමක් සිදුවී ඇති අවස්ථාවක් සඳහා වන උපදෙස්: පද්ධතිය බිඳවැටීමක් සිදු වී ඇති අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින් උපදෙස් බැංකුවට පිළිගතහැකි වෙනත් ආකාරයකින් බැංකුව වෙත ලබාදිය හැකි අතර, එම උපදෙස් පිළිගැනීම සහ බලාත්මක කිරීම බැංකුවේ පූර්ණ අභිමතය පරිදි විය යුතු ය.

8.3 ලිඛිත අත්සන : උපදෙස් ලිඛිතව ඇතුළත් කර ගත හැකිවීමට ගනුදෙනුකරු සහ බැංකුව එකඟව ඇත්තේ කවර බලයලත් පරිශීලකයන්ගේ ද, එම බලයලත් පරිශීලකයන් සඳහා ගනුදෙනුකරු විසින් ආදර්ශ අත්සන් සපයනු ලැබිය යුතු අතර අදාළ උපදෙස්වල අව්‍යාජත්වය පිළිබඳව ප්‍රමාණවත් ඔප්පුකිරීමක් ලෙස එම ආදර්ශ අත්සන් තහවුරු කිරීමට දිස්වන අත්සන් මත බැංකුව විසින් නිශ්චිත වශයෙන්ම විශ්වාස තැබිය හැකි ය.

8.4 UB යතුරු අත්සන, මෘදුකාංග ටෝකන් පත, SMS OTP, විද්‍යුත් තැපැල OTP සහ ගනුදෙනු මුරපදයඃ බැංකුව විසින් අදාළ උපදෙසක අව්‍යාජත්වය පිළිබඳව ප්‍රමාණවත් ඔප්පු කිරීමක් වශයෙන් යම් UB යතුරු/ ගනුදෙනු මුරපදයක් විසින් ඉදිරිපත් කරනු ලබන ඩිජිටල් අත්සනක් මත නිශ්චිත වශයෙන්ම විශ්වාසය තැබිය හැකි ය. මාර්ගගත ගනුදෙනු අනුමත කිරීම සඳහා ගනුදෙනුකාර බලය ලබා දෙන්නන් වෙත මුරපද නිකුත් කරනු ලබන අතර ගනුදෙනුකාර බලය ලබා දෙන්නන් විසින් බැංකුවට පෙර දැන්වීමක් සිදු කර යම් දෙන ලද ස්ථානයකදී UB යතුරු අත්සන, මෘදුකාංග ටෝකන් පත, SMS OTP, විද්‍යුත් තැපැල් OTP හෝ ගනුදෙනු මුරපද ක්‍රමය යන කවර හෝ ක්‍රමයක් භාවිතා කළ හැකි ය.

8.5 උපදෙස් මත බැංකුවේ විශ්වාසය ඃ ඉහත 8.1 වන, 8.2 වන සහ 8.3 වන වගන්තිවල දක්වා ඇති විධිවිධානවලට අගති රහිතව, පද්ධතිය හරහා බැංකුවට ලැබෙන යම් උපදෙස් හෝ වෙනත් සන්නිවේදනවල අව්‍යාජත්වය සහ යථා පරිදි බලය ලබා දීම මත, මෙම නියම හා කොන්දේසිවල විධිවිධාන සලසා ඇති ආකාරයෙන් බැංකුව නිශ්චිත වශයෙන්ම විශ්වාසය තැබිය හැකි අතර එම උපදෙස් සහ/හෝ වෙනත් සන්නිවේදන ක්‍රියාත්මක කිරීම සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව වෙත යථා පරිදි බලය ලබා දී ඇත.

8.6 අසම්පූර්ණ උපදෙස් ඃ බැංකුවේ සාධාරණ මතය අනුව ගනුදෙනුකරුගේ අදහස අනුමාන කිරීම සඳහා බැංකුව වෙත එම අසම්පූර්ණ උපදෙස්වල ප්‍රමාණවත් තොරතුරක් අන්තර්ගතව ඇති අවස්ථාවකදී, බැංකුව විසින් අසම්පූර්ණ උපදෙස් මත කටයුතු කරනු ලැබිය හැකි ය.

8.7 බැංකුව විසින් අතරමැදියන්, නියෝජිතයින් සහ සන්නිවේදන පද්ධති භාවිත කිරීම ඃ බැංකුව විසින් උපදෙස් බලාත්මක කිරීමේදී මෙම නියම හා කොන්දේසි සහ ගනුදෙනුකරු

සමග වන වෙනත් යම් නියම හා කොන්දේසි යටතේ සේවා සපයමින් සහ බැංකුවේ යුතුකම් අන්‍යාකාරයෙන් ඉටුකරමින් නියෝජිතයන්, අතරමැදියන් සහ වෙනත් තෙවන පාර්ශ්වයන් භාවිත කළ හැකි අතර සන්නිවේදන සහ දත්ත සම්ප්‍රේෂණ පද්ධති හා සේවා සපයන්නන් තෝරා ගැනීම සහ භාවිත කිරීම කරනු ලැබිය හැකි ය. මෙම වගන්තිය යටතේ බැංකුව සතු අයිතිවාසිකම් වෙනත් යම් නියම හා කොන්දේසි යටතේ හෝ අන්‍යාකාරයෙන් බැංකුව සතුවිය හැකි යම් වෙනත් අයිතිවාසිකම්වලට අමතරව සහ එම යම් වෙනත් අයිතිවාසිකම්වල අගය අඩු නොවන පරිදි විය යුතුය.

8.8 උපදෙස් ක්‍රියාවට නැංවීමට අපොහොසත් වීම : සාධාරණව ක්‍රියාකරමින්, යම් උපදෙසක් හෝ සියලු උපදෙස් තමා විසින් ක්‍රියාත්මක නොකිරීම හෝ ඒ පිළිබඳව අන්‍යාකාරයෙන් කටයුතු කිරීම අවශ්‍ය වන බවට හෝ උචිත වන බවට බැංකුව විසින් සලකනු ලබන අවස්ථාවකදී, බැංකුව විසින් ලියාපදිංචි තැපැල් ලිපියක් හෝ විද්‍යුත් තැපැල හෝ දුරකතනය මගින් ප්‍රායෝගිකව හැකි ඉක්මනින් ඒ පිළිබඳව ගනුදෙනුකරු වෙත දැන්විය යුතු අතර දුරකතනයෙන් නිවේදනය ලබා දිය ඇති අවස්ථාවක දී, ඉහත නිවේදනය විද්‍යුත් තැපැල මගින් තහවුරු කළ යුතුය. (විද්‍යුත් තැපැල මගින් තහවුරු කිරීමට අපොහොසත් වීම දුරකතන නිවේදනයේ වලංගුභාවයට බලපෑම් නොකළ යුතුය) එසේ වුවද, එසේ උපදෙස් ක්‍රියාත්මක නොකිරීම හෝ අන්‍යාකාරයෙන් කටයුතු කිරීම සඳහා බලපෑ බැංකුව සතුවන හේතු පිළිබඳව ගනුදෙනුකරු වෙත පූර්ව දැන්වීමක් (එසේ කිරීම සාධාරණ ලෙස ප්‍රායෝගිකවන අවස්ථාවකදී) හෝ පසුව කෙරෙන දැන්වීමක් (ඉන් පසුව සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්) බැංකුව විසින් සිදු කරනු ලැබිය යුතු ය.

8.9 **විදේශ විනිමය** : උපදෙසක් මත හෝ 3.4 වන වගන්තිය (ගිණුම හර කිරීම සහ හිලව් කිරීම) යටතේ යම් ගිණුම හර කිරීමක් හෝ හිලව් කිරීමක් සිදුකිරීම මත එක් මුදල් ඒකකයක සිට වෙනත් මුදල් ඒකකයකට මුදල් පරිවර්තනය කිරීම අවශ්‍ය වන අවස්ථාවකදී, බැංකුව විසින් බැංකුවේ පවත්නා ස්ථානීය හුවමාරු අනුප්‍රමාණයට එම පරිවර්තනය කිරීම බලාත්මක කළ යුතුය.

9. **ගිණුම්**

9.1 **බැංකු ගිණුම් අවසානාත්මක වීම** : බැංකුවේ සාමාන්‍ය පරිචයට අනුකූලව බැංකු ගිණුම්වල කරනු ලබන ඇතුළත් කිරීම් සහ පවත්වාගෙන යනු ලබන වාර්තා පැහැදිලි දෝෂ නොමැති වීමේදී උපදෙස්, ගෙවීම් මාර්ගය, ගිණුම් ශේෂ, ගනුදෙනු සහ ඒවායේ අදාල අංගයන් සහ ඒවා යවන ලද, ලැබුණු හෝ බලාත්මක කරන ලද කාලයන් සම්බන්ධයෙන් අවසානාත්මක විය යුතු ය. ගනුදෙනුකරු විසින් එම ගිණුම් සහ වාර්තා මුල් ලේඛන නොවන බව, ලිඛිත නොවන බව, වෙනත් අයෙකුගෙන් ඇසීමෙන් පමණක් දන්නා බව සහ/හෝ පරිගණකයකින් ඉදිරිපත් කිරීම යන හේතු මත පමණක් නඩු කාර්යපටිපාටියකදී සාක්ෂි

වශයෙන් එම ගිණුම් හා වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විරෝධය පළ නොකිරීමට එකඟව සිටිනු ලැබේ.

9.2 **බැංකුවේ දත්ත සමුදායෙන් තොරතුරු ලබා ගැනීම :** බැංකුවේ දත්ත සමුදායෙන් පද්ධතිය හරහා ගනුදෙනුකරුට ලැබෙන යම් මූල්‍ය තොරතුරු හෝ වෙනත් තොරතුරු, උපදෙස් බලාත්මක කිරීමේ අරමුණ උදෙසා පමණක්ම වන බව ගනුදෙනුකරු පිළිගත යුතු ය. ගනුදෙනුකරු විසින් එම තොරතුරු සඳහා කිසිදු හිමිකාරීත්ව අයිතියක් අත්කර නොගත යුතු අතර වෙනත් යම් කාර්යයක් සඳහා එම තොරතුරු භාවිත කිරීමට හෝ පිටපත් කිරීමට කිසිදු අයිතියක් ගනුදෙනුකරුට නොමැත.

10. **පද්ධති ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යෑම සහ නම් කළ අඩවි වලට ප්‍රවේශ වීම**

10.1 **භාවිත කිරීමේ අයිතිය ප්‍රධානය කිරීම:** 2.1 වන වගන්තියේ (භාවිත කිරීමේ අයිතිය සඳහා වන ගාස්තුව) දක්වා ඇති පරිදි පද්ධතිය භාවිත කිරීමේ අයිතිය ගනුදෙනුකරුට ප්‍රධානය කිරීම සඳහා වන අයිතිය බැංකුව සතුවන බවට බැංකුව සහතික කරනු ලබයි.

10.2 **ක්‍රියාකාරිත්වය පිළිබඳ සහතික නොකිරීම:** පද්ධතිය, සේවාවන් හෝ පරිශීලක මාර්ගෝපදේශය දෝෂයන්ගෙන්, බිඳවැටීමෙන් හෝ වෛරස් දූෂණයන්ගෙන් තොර හෝ තොරවනු ඇති බවට, හෝ ඒවා ගනුදෙනුකරු බලාපොරොත්තු වන නිශ්චිත අරමුණක් හෝ ප්‍රතිඵලයක් සඳහා සම්පූර්ණ, යාවත්කාලීන හෝ සුදුසු වන බවට, හෝ පද්ධතිය භාවිතය බාධාවකින් තොරව සිදුවිය යුතු බවට බැංකුව විසින් සහතික නොකරයි. හිමිකාරීත්වය පිළිබඳ සහතික, කාර්යයන් සහ ක්‍රියාකාරීත්වය සඳහා යෝග්‍යවීම සම්බන්ධ සහතික ඇතුළුව නමුත් ඒවාට සීමා නොවන මෙම නියම හා කොන්දේසි වල විධිවිධාන සලසා නොමැති යම් සහතිකකිරීම් ගනුදෙනුකරු විසින් මෙයින් අත්හරිනු ලබයි.

10.3 **නඩත්තු කිරීම :** පද්ධතිය සහ යම් සේවාවන්, සේවා මට්ටම් ප්‍රමිතීන් සහ පරිශීලක මාර්ගෝපදේශය සමඟ මෙම නියම හා කොන්දේසිවල අරමුණු කරනු ලබන ක්‍රියාකාරිත්ව මට්ටම්වලට සාරානුකූලව අනුකූලවන බව සහතික කිරීම සඳහා (අවශ්‍ය නම්, පද්ධතියේ හෝ එහි යම් අංගයක ක්‍රියාකාරීත්වයට බාධා කරමින් හෝ අත්හිටුවමින් ඇතුළුව) පද්ධතිය යාවත්කාලීන කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය සියලු සාධාරණ පියවර බැංකුව විසින් ගනු ලැබිය යුතු ය. එවැනි යාවත්කාලීන කිරීමක දී සහ නඩත්තුවකදී ගනුදෙනුකරු විසින් බැංකුව සමඟ සම්පූර්ණ සහයෝගයෙන් යුතුව කටයුතු කරනු ලැබිය යුතු අතර ඒ සඳහා ගත වන කාලය බැංකුවේ අභිමතය පරිදි විය යුතුය.

10.4 **තොරතුරු වාර්තා කිරීම සඳහා ගනුදෙනුකරු සතු වගකීම :** ගනුදෙනුකරුගේ වාර්තා පවත්වාගෙන යාමට ඔහුට හැකියාව ලබාදීමට සහ අවශ්‍ය නම් යළි සකසා ගැනීමට අවශ්‍ය සියලු සාධාරණ සහාය බැංකුව විසින් සපයනු ලැබුවද, ගනුදෙනුකරු විසින් පද්ධතියට ඇතුළත් කරනු ලබන හෝ පද්ධතිය හරහා සම්ප්‍රේෂණය කරනු ලබන යම් තොරතුරු හෝ දත්ත වාර්තා කිරීම සහ අතිරේක පිටපතක් සාදා තබා ගැනීම සඳහා ගනුදෙනුකරු වග කියනු ලැබිය යුතුය.

10.5 **නම්කල උපකරණයකට ප්‍රවේශ වීම :** මෙම නියම හා කොන්දේසි සහ සේවා මට්ටම් ප්‍රමිතීන් යටතේ බැංකුව සතු යුතුකම්වලට අනුකූලව කටයුතු කිරීමට බැංකුවට හැකියාව ලබාදීමේ කාර්ය සඳහා (නම් කළ උපකරණයට සාධාරණ ලෙස ප්‍රවේශය සැපයීම ඇතුළුව) සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි යම් පහසුකම් සහ තොරතුරු ගනුදෙනුකරු විසින් බැංකුවේ සේවා නියුක්තිකයන්ට සහ නම් කළ නියෝජිතයන්ට ලබාදිය යුතුය.

11**. රහස්‍යභාවය**

11.1 **රහස්‍යභාවය භාරගැනීම** : 11.2 වන වගන්තියට (බැහැර කිරීම්) යටත්ව, මෙම නියම හා කොන්දේසි සම්බන්ධයෙන් බැංකුව විසින් කලින් කල ගනුදෙනුකරුට ලබාදෙන පද්ධතිය, පරිශීලක මාර්ගෝපදේශය, සේවාවන් සහ වෙනත් යම් ලේඛන බලයලත් පරිශීලකයන් විසින් සෑම අවස්ථාවකදීම දැඩි ලෙස රහස්‍ය වශයෙන් සැලකිය යුතු බවටත්, බලයලත් පරිශීලක හැර වෙනත් තැනැත්තකුට ඒවායින් කිසිවක්, හෝ ඒවායින් යම් කොටසක් හෝ ඒවාට අදාල යම් තොරතුරක් හෙළිදරව් කිරීම, අනාවරණය කිරීම, අනුපිටපත් කිරීම, පිටපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ බෙදාහැරීම නොකළ යුතු බවටද, ඒවා බැංකුව වෙනුවෙන් සන්තකයේ තබාගත යුතු බවට සහ ඒවා හැසිරවීමේදී, භාවිතා කිරීමේදී සහ ගබඩා කිරීමේදී සාධාරණ සැලකිල්ලකින් යුතුව කටයුතු කළ යුතු බවට ගනුදෙනුකරු විසින් සැලසිය යුතු ය, නැතහොත් සලසනු ලැබිය හැකි ය.

11.2 **බැහැර කිරීම් :** පහත දැක්වෙන පරිදි ගනුදෙනුකරු විසින් ඔප්පු කරන්නාවූ යම් තොරතුරක් සඳහා 11.1 වන වගන්තියේ (රහස්‍යභාවය භාරගැනීම) විධි විධාන අදාළ නොවේ.

11.2.1 11.1 වන වගන්තිය (රහස්‍යභාවය භාර ගැනීම) උල්ලංඝනය කිරීමක් මගින් නොවන පොදු ඩොමේනයක ඇති හෝ පොදු ඩොමේනයකට ඇතුලත් කරන තොරතුරක් වන බව;

11.2.2 යම් නීතියක් විධානයක් මගින් අනාවරණය කිරීමට නියමිත තොරතුරක් වන බව;

11.3 **බැංකුව විසින් අනාවරණය කිරීම :** ගනුදෙනුකරුගේ යම් සහ සියලු තොරතුරු, (සේවා මට්ටම් ප්‍රමිතීන් සහ/හෝ සේවාවන්වලින් හෝ ඒවා සම්බන්ධයෙන් හටගන්නා වූ යම් ගනුදෙනු හෝ සම්බන්ධතා ඇතුළත්ව, නමුත් ඒවාට සීමා නොවන) ගනුදෙනුකරු සහ බැංකුව අතර සිදුවූ යම් ගනුදෙනු හෝ සම්බන්ධතා හෝ ගිණුම (ගිණුම්) කවර ආකාරයේ හෝ අරමුණක් සඳහා පහත දැක්වෙන තැනැත්තන් හෝ ආයතන වෙත අනාවරණය කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත හෝ බැංකුවේ යම් නිලධරයකු වෙත හෝ යම් තැනැත්තකුගේ තත්ත්වය හෝ ධූරය හේතුවෙන් යම් ආකාරයකින් බැංකුවේ වාර්තාවලට හෝ බැංකුවේ යම් ගනුදෙනුකරුවකුගේ ගිණුමට අදාලව රෙජිස්ටරයට හෝ යම් ලිපිහුවමාරුවලට හෝ ලේඛනවලට ප්‍රවේශය ඇත්තේ ද එවැනි යම් තැනැත්තෙකු වෙත මෙයින් ප්‍රකාශිතව බලය ලබා දෙනු ලැබේ:

11.3.1 කවර ස්ථානයක හෝ පිහිටි බැංකුවේ ඕනෑම ශාඛාවක්, පාලිත සමාගමක්, ආශ්‍රිත සමාගමක්, හෝ අනුබද්ධිත සමාගමක් වෙත;

11.3.2 සියලු රාජ්‍ය නියෝජිතායතන, නියාමන අධිකාරීන් හෝ යම් නීතියක් හෝ විධානයක් මගින් අනාවරණය කිරීම නියම කර ඇති අවස්ථාවකදී යම් අධිකරණ බල ප්‍රදේශයක අධිකරණ වෙත; සහ

11.3.3 ඉහත 8.7 වන වගන්තියේ (බැංකුව විසින් අතරමැදියන්, නියෝජිතයන් සහ සන්නිවේදන පද්ධති භාවිත කිරීම) සඳහන් යම් නියෝජිතයන් අතරමැදියන් සහ වෙනත් තෙවන පාර්ශ්වයන් සහ යම් සන්නිවේදනයන්, දත්ත සම්ප්‍රේෂණ පද්ධති සහ සේවා සපයන්නන් ඇතුළුව නමුත් ඊට සීමා නොවන ආකාරයේ) බැංකුවට කාර්ය ඉටු කිරීමට හෝ සේවාවන් සැපයීමට එකඟ වී ඇති යම් වෘත්තීයමය උපදේශකයන්, නියෝජිතයින් හෝ ගිවිසුම්කරුවන් වෙත;

11.3.4 බැංකුව විසින්, අදාළ නීති සහ නියෝග ප්‍රකාරව යම් සැක කටයුතු සහ නියම කරන ලද සීමාවන් ඉහළ ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකක වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකාවේ පවත්නා යම් නීති හෝ නියෝගවලට අනුකූලව බැංකුව විසින් ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක් සඳහා බැංකුව වගකියනු නොලැබිය යුතු ය. කෙසේ වුව ද, අවසරලත් සීමාවට ඉහළ ඕනෑම ගනුදෙනුවක් (අදාල වන පරිදි) බැංකුව විසින් ස්වයංක්‍රීයව අවහිර කරනු ලැබිය යුතු ය.

මෙම වගන්තිය යටතේ බැංකුව සතු අයිතිවාසිකම්, වෙනත් යම් නියම හා කොන්දේසි යටතේ හෝ අන්‍යාකාරයෙන් බැංකුව සතු විය හැකි වෙනත් යම් එවැනි අයිතිවාසිකම්වලට අමතරව සහ ඒවායේ වටිනාකම අඩු නොවන ආකාරයෙන් විය යුතු ය.

11.4 **ගනුදෙනුකරුගේ රහස්‍යභාවය පිළිබඳ යුතුකම් විඳදරා ගැනීම :** සේවාවන් කල් ඉකුත් වීම හා අවසන් වීම නොසලකා, අදාල නීති මගින් අවසර ලබාදෙන තාක් දුරට, රහස්‍යභාවය පිළිබඳ ගනුදෙනුකරුගේ යුතුකම් අඛණ්ඩව බලාත්මක විය යුතුය.

12. **වගකීම සහ හානිපූරණය**

12.1 **බැංකුව සතු වගකීම :** මෙම නියම හා කොන්දේසි මගින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වන තාක්දුරට හැර පහත දැක්වෙන අවස්ථා මගින් ඍජු හෝ වක්‍රව ඇතිවිය හැකි, සේවාවන් සහ සේවා මට්ටම් ප්‍රමිතීන්, පරිශීලක මාර්ගෝපදේශය, හෝ පද්ධතිය හෝ සේවාවන් සම්බන්ධයෙන් කවර ආකාරයෙන් හෝ උපචිත වන යම් පාඩුවක් සඳහා හෝ පාඩුවක් සම්බන්ධයෙන් (ගිවිසුමකදී හෝ නොසැලකිල්ල සඳහා වන තෝරතයක දී හෝ අන්‍යාකාරයෙන්) බැංකුව වගකියනු නොලැබිය යුතු ය.

12.1.1 අන්තර්ජාලය, නම් කළ උපකරණය හෝ මෘදුකාංගය හෝ යම් දුරකතන රැහැනක් හෝ වෙනත් සන්නිවේදන හෝ දත්ත පද්ධතියක්, සේවා සබැඳියක්, සේවා සපයන්නකු හෝ උපකරණයක් අක්‍රියව පවතින යම් කාලයක් හෝ ලබාගත නොහැකි වීමක් බිඳවැටීමක්, ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමක්, වෙනස් කිරීමක් හෝ බාධා වීමක් මගින්;

12.1.2 වෛරස මගින් ඇතිවන දූෂණයක් මගින්;

12.1.3 යම් උපදෙස්වල හෝ නිවේදනවල හෝ ගිණුම්වලට හෝ මූල්‍ය තොරතුරුවලට අදාල තොරතුරුවල යම් වරදක්, විෂමතාවක්, බහු අරුත් සහිත බවක් හෝ (තොරතුරු හෝ උපදෙස් සම්ප්‍රේෂණය කිරීමට අපොහොසත් වීමක් ඇතුළුව) තොරතුරු හෝ උපදෙස් ලබාදීමේ දී සිදුවන ප්‍රමාදයක් මගින්;

12.1.4 කාර්මික ආරවුල් මගින්;

12.1.5 පරිශීලක මාර්ගෝපදේශයේ නිශ්චිතව දක්වා ඇති පාරිසරික හෝ ක්‍රියාත්මක වීමේ තත්ත්වයන්ට පටහැනි පාරිසරික හෝ ක්‍රියාත්මක වීමේ තත්ත්වයන්වලදී NEOS Corporate හෝ නම් කළ උපකරණය භාවිත කිරීම මගින්;

12.1.6 බැංකුව විසින් ඇති නොකළ යම් භෞතික හෝ විද්‍යුත් හානියක් මගින්;

12.1.7 පද්ධතිය, සේවාවන් හෝ ගනුදෙනුකරු සම්බන්ධයෙන් වන යම් රහස්‍ය හෝ වෙනත් තොරතුරක්, තොරතුරු රැස් කිරීමක්, උපදෙස්, නිවේදන, වාර්තා හෝ පණිවුඩ අවසර නොමැති තැනැත්තකු විසින් ලබා ගැනීමක් මගින්;

12.1.8 8.8 වගන්තිය (උපදෙස් ක්‍රියාවට නැංවීමට අපොහොසත් වීම) යටතේ බැංකුව විසින් ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක් මගින්;

12.1.9 ගනුදෙනුකරු, යම් නියෝජිතයකු, අතරමැදියකු, අනුයෝජිතයකු, ගෙවීම් කරනු ලබන බැංකුව හෝ යම් තෙවන පාර්ශ්වයක් විසින් කරනු ලබන යම් ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ ඔවුන්ගෙන් සිදුවන යම් ප්‍රමාදයක් මගින්;

12.1.10 නම් කළ උපකරණය, පද්ධතිය හෝ සේවාවන් බලය නොමැති කාර්යයන් සඳහා හෝ සේවා මට්ටම් ප්‍රමිතීන් සමඟ මෙම නියම හා කොන්දේසිවලට අනුකූල නොවන හෝ ඒවා උල්ලංඝනය කරන ආකාරයකින් හෝ තෙවන පාර්ශ්වයක අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයකින් සිදු කරනු ලබන භාවිත කිරීමක් මගින්;

12.1.11 පද්ධතිය නඩත්තු කිරීමට අදාළ යම් පාඩුවක් මගින්;

12.1.12 යම් භාවිත කිරීමක් නොවන්නට, උල්ලංඝනය කිරීම පිළිබඳ හිමිකම්පෑමක් උද්ගත නොවන අවස්ථාවකදී, පද්ධතිය හෝ එහි යම් අංගයක් වෙනත් යම් පද්ධතියක්, උපකරණයක් හෝ මෘදුකාංගයක් සමඟ එසේ භාවිත කිරීම මත පදනම්ව හෝ එසේ භාවිත කිරීමෙන් හටගත් යම් උල්ලංඝනය කිරීමේ නඩුවක් හෝ හිමිකම්පෑමක් මගින්;

12.1.13 පාඩුව බැංකුව විසින් සාධාරණ ලෙස පූර්වෙක්ෂණය කළ හැකි වුවද, නොහැකි වුවද, බැංකුවේ සාධාරණ පාලනයට පිටතින් වන යම් සිදුවීමක්, ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ අවස්ථානගත කරුණක් මගින්; ඊට අමතරව යම් ගනුදෙනුකරුවකුට සිදුවන යම් ආනුෂංගික පාඩු හෝ ලාබ අහිමිවීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් වගකියනු නොලැබිය යුතු ය.

12.2 බැංකුව හානිපූරණය කිරීම : ඉල්ලා සිටිනු ලැබූ විට, පහත දැක්වෙන කාරණා හේතුවෙන් හෝ පහත දැක්වෙන කාරණාවලට සම්බන්ධව බැංකුවට උපචිත වූ හෝ බැංකුව විසින් විඳින ලද සියලු නඩු, බැරකම්, හිමිකම්පෑම්, නඩුකර, වියදම්, හානි, ඉල්ලීම් සහ

පාඩුවලින් සහ ඒවාට එරෙහිව බඳු පනවනු ලැබූ අවස්ථාවේ දී හෝ ඉන්පසුව බැංකුව සම්පූර්ණයෙන් හාණිපූරණය කර අගතිවිරහිතව තැබීමට ගනුදෙනුකරු කටයුතු කළ යුතු ය:-

12.2.1 7.2 වන වගන්තියේ (ආරක්ෂාව කඩකිරීම) අපේක්ෂා කර ඇති පරිදි හෝ අන්‍යාකාරයෙන් වුව ද, ආරක්ෂාව කඩකිරීමක් තිබේ නම්, පද්ධතිය සහ/හෝ නම්කළ උපකරණය වසා දැමීමට (Shut down) සහ/හෝ නැවැත්වීමට (log off) ගනුදෙනුකරු අපොහොසත් වීම;

12.2.2 නීතිවිරෝධී, අසම්පූර්ණ, බහුඅරුත් සහිත සහ/හෝ දෝෂ සහිත උපදෙසක් හෝ කිසිදිනෙක බැංකුවට නොලැබුණු උපදෙසක් (බාර දී නොතිබුණ ද, වැරදි ලෙස බාරදී තිබුණද) හෝ බැංකුවට ප්‍රමාද වී ලැබුණු උපදෙසක් ඇතුළුව නමුත් ඊට සීමා නොවන උපදෙසක් මත හෝ උපදෙසක් සංශෝධනය කිරීම සඳහා හෝ අවලංගු කිරීම සඳහා වන යම් ඉල්ලීමක් මත බැංකුව කටයුතු කිරීම හෝ කටයුතු නොකිරීම;

12.2.3 මූල්‍ය තොරතුරුවල වැරදි හෝ අතපසුවීම්;

12.2.4 2.3 වගන්තියේ (පද්ධතිය අනවසරයෙන් භාවිත නොකිරීම) හෝ අන්‍යාකාරයෙන් ගනුදෙනුකරු, බලයලත් පරිශීලයකු හෝ ගනුදෙනුකරුගේ නිලධරයන්, සේවා නියුක්තයන් හෝ අනුයෝජිතයන් විසින් පද්ධතිය හෝ සේවාවන් භාවිත කිරීම හෝ අවභාවිත කිරීම හෝ මෙම නියම හා කොන්දේසිවල ආරක්ෂණ විධිවිධානවලට හෝ බැංකුව විසින් ගනුදෙනුකරු වෙත අන්‍යාකාරයෙන් ලිඛිතව සන්නිවේදනය කරන ලද ආරක්ෂණ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම;

12.2..5 ගනුදෙනුකරුගේ පාලනය තුල තිබෙන යම් පරිගණක පර්යන්ත හෝ උපකරණ හෝ ජනසන්නිවේදන උපකරණ භාවිත කිරීම හෝ අවභාවිත කිරීම;

12.2.6 ගනුදෙනුකරු, යම් බලයලත් පරිශීලකයකු, හෝ ගනුදෙනුකරුගේ නිලධරයන්, සේවා නියුක්තයන් හෝ අනුයෝජිතයන් විසින් බැංකුවට සපයනු ලබන තොරතුරු;

12.2.7 ගනුදෙනුකරුගේ ඉල්ලීම මත, බැංකුව විසින් ගනුදෙනුකරුට, ගනුදෙනුකරු සමඟ අනුබද්ධිත පාර්ශවයන්ට, වෙනත් තෙවන පාර්ශ්වයන්ට, හෝ බලයලත් පරිශීලකයන්ට හෝ ගනුදෙනුකරුගේ නිලධරයන්ට, සේවා නියුක්තයන්ට හෝ අනුයෝජිතයන්ට තොරතුරු සපයනු ලබන අවස්ථාවේ දී එම තොරතුරු ගනුදෙනුකරු විසින් භාවිත කිරීම;

12.2.8 පද්ධතිය හරහා වැරදි, ප්‍රමාද වූ කේතවලට පරිවර්තනය නොකළ අසම්පූර්ණ ගිණුම්වලට අදාළ උපදෙස්, නිවේදන, (යම් උපදෙසක් හෝ නිවේදනයක් සම්ප්‍රේෂණය කිරීමට නොහැකිවීමක් ඇතුළුව) තොරතුරු හෝ මූල්‍ය තොරතුරු සම්ප්‍රේෂණය කිරීම;

12.2.9 ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු යම් ප්‍රතිපූරණය කළ හැකි මුදලක්;

12.2.10 (i) ගනුදෙනුකරුගේ අදාළ ගිණුම් ශේෂය හෝ එම ගිණුමට අදාළ වන සීමාව අරමුණේ කාර්යය සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී;

(ii) බැංකුව විසින් යම් ආකාරයකින් ගනුදෙනුකරුගේ බැංකු පහසුකම් හෝ අයිතිවාසිකම් අත්හිටුවා ඇති අවස්ථාවක දී;
(iii) උපදෙස සම්බන්ධයෙන් වන හෝ උපදෙසට අදාළ ගනුදෙනුව සම්බන්ධයෙන් වන නඩු කාර්ය පටිපාටි පිළිබඳව බැංකුව දැනුවත් ව සිටින අවස්ථාවක දී;

(iv) බැංකුව උපදෙස ක්‍රියාත්මක කර නොමැති බව හෝ බැංකුව උපදෙස ක්‍රියාත්මක නොකරනු ඇති බව බැංකුව විසින් ගනුදෙනුකරුට නිවේදනය කර ඇති අවස්ථාවක දී; හෝ

(v) ගනුදෙනුකරු විසින් මෙම නියම හා කොන්දේසි උල්ලංඝනය කර ඇති අවස්ථාවක දී,

බැංකුව උපදෙසක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම.

මෙම හානිපූරණය කිරීම ගනුදෙනුකරු විසින් බැංකුවට සපයනු ලබන වෙනත් යම් හානිපූරණයන්ට අමතරව සහ එම වෙනත් හානිපූරණයන්ගේ අගය අඩු නොවන පරිදි විය යුතු ය.

12.2.11 ගනුදෙනුකරු, බලයලත් පරිශීලකයන් හෝ ගනුදෙනුකරුගේ නිලධරයන්, සේවකයන් හෝ අනුයෝජිතයන් විසින් කවර ආකාරයකින් හෝ NEOS Corporate භාවිත කිරීම සහ ඉලෙක්ට්‍රොනිකව දත්ත එහා මෙහා යැවීමේ දී සහ ලිඛිත ඉල්ලීමක් මත බැංකුව විසින් මුල් මුරපදය/මුරපද සහ/හෝ පසු මුරපද ගනුදෙනුකරු හෝ බලයලත් පරිශීලකයන් වෙත ජනනය කිරීම සහ නිකුත් කිරීම හේතුවෙන් දත්ත යම් නැතිවීමක් සිදුවීම සහ/හෝ නොමඟ යැවීමක් සිදුවීම,

12.3 මියයාම හෝ ශාරීරික හානි : මේ නියම හා කොන්දේසි සම්බන්ධයෙන් වන ගනුදෙනුකරුගේ නොසැලකිල්ල හේතුවෙන් හෝ ගනුදෙනුකරුගේ සේවානියුක්තයන්ගේ,

අනුයෝජිතයන්ගේ හෝ උපගිවිසුම්කරුවන්ගේ නොසැලකිල්ල හේතුවෙන් ඇති වූ මරණයක් හෝ ශාරීරික හානියක් සඳහා හෝ වංචාව පිළිබඳ තෝරතය සඳහා කවර පාර්ශ්වයක් හෝ සතු වගකීම මෙම නියම හා කොන්දේසිවල සඳහන් කිසිවකින් සීමා නොකළ යුතු ය.

12.4 අමතර වගකීම් නොමැතිවීම: මෙම 12 වන වගන්තිය (වගකීම සහ හානිපූරණය) මෙම නියම හා කොන්දේසිවල සියලු සහ වෙනත් වගන්තීන් අභිබවා බලාත්මක වන අතර එමගින්, පද්ධතිය, සේවා මට්ටම් ප්‍රමිතීන්, පරිශීලක මාර්ගෝපදේශය, ගිණුම් මැන්ඩේට්පත්‍රය සහ සේවාවන් සම්බන්ධයෙන් ගිවිසුමක වුව ද, තෝරතයක වුවද ගනුදෙනුකරු කෙරෙහි බැංකුව සතු නිශ්චිත වගකීම දක්වයි.

13. ගනුදෙනුකරුගේ ඉදිරිපත්කිරීම් සහ සහතික කිරීම්

බැංකුවේ ප්‍රයෝජනය සඳහා ගනුදෙනුකරු විසින් පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කර සහතික කරනු ලැබේ.

13.1 **පවත්නා තත්ත්වය** : ගනුදෙනුකාර ආයතනය යථා පරිදි සංස්ථාගතකර ඇති අතර එය සංස්ථාගත කරන ලද අධිකරණ බලප්‍රදේශයේ නීති යටතේ වලංගුව පවතියි.

13.2 **බලතල :** මෙම නියම හා කොන්දේසි, සේවා මට්ටම් ප්‍රමිතීන් සහ පරිශීලක මාර්ගෝපදේශ යනාදියට එළඹීමට, ඒ යටතේ වන ගනුදෙනුකරුගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සහ ඒ යටතේ වන ගනුදෙනුකරුගේ යුතුකම් ඉටුකිරීමට සහ එම යුතුකම්වලට අනුකූලව කටයුතු කිරීමට ගනුදෙනුකරුට බලය ඇත.

13.3 **බලය ලබා දීම සහ කැමැත්ත ලබා දීම්:**

(i) ගනුදෙනුකරුට මෙම නියම හා කොන්දේසි, සේවා මට්ටම් ප්‍රමිතීන් සහ පරිශීලක මාර්ගෝපදේශය යනාදියට නීත්‍යානුකූලව එළඹීමට, ඒ යටතේ වන ගනුදෙනුකරුගේ අයිතිවාසිකම් නීත්‍යානුකූලව, ක්‍රියාත්මක කිරීමට සහ ඒ යටතේ වන ගනුදෙනුකරුගේ යුතුකම් නීත්‍යානුකූලව ඉටු කිරීමට සහ නීත්‍යානුකූලව එම යුතුකම්වලට අනුකූලව කටයුතු කිරීමට ඉඩ ලබාදීම සඳහා;

(ii) එම යුතුකම් වලංගු, නීතියෙන් බැඳීමට ලක්වන සහ බලාත්මක කළ හැකි බවට සහතික කිරීම සඳහා; සහ

(iii) මෙම නියම හා කොන්දේසි, සේවා මට්ටම් ප්‍රමිතීන් සහ පරිශීලක මාර්ගෝපදේශය ගෙන ඇති, සම්පූර්ණ කර ඇති සහ ඉටුකර ඇති බවට අදාළ සියලු අධිකරණ බලප්‍රදේශවල අධිකරණවල සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ හැකි කිරීම සඳහා;

(අවශ්‍ය බලපත්‍ර, අවසරපත්‍ර, කැමැත්ත ලබාදීම් ලබාගැනීම සහ ලියාපදිංචි කිරීම් සහ එවැනි දේ සිදුකිරීම ඇතුළුව) සියලු අදාල නීති සහ විධාන යටතේ අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග, කොන්දේසි සහ දේ ගනු ලබන බව, සම්පූර්ණ කරනු ලබන බව සහ කරනු ලබන බව.

13.4 **උල්ලංඝනය නොකිරීම** : මෙම නියම හා කොන්දේසි, සේවා මට්ටම් ප්‍රමිතීන් යටතේ ගනුදෙනුකරු විසින් එහි අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සහ/හෝ එහි යුතුකම් ඉටුකිරීමට හෝ එහි යුතුකම්වලට අනුකූලව කටයුතු කිරීමට ආරම්භ කිරීම මගින්:-

(i) ගනුදෙනුකරු යටත්වන යම් නීතියක්

(ii) ගනුදෙනුකරුගේ සංගමික ව්‍යවස්ථාවලිය හෝ වෙනත් සංස්ථාපන ලේඛන හෝ

(iii) ගනුදෙනුකරු පාර්ශ්වයක් වන යම් නියම හා කොන්දේසි

උල්ලංඝනය නොකරනු ලැබේ; නැතහොත් උල්ලංඝනය නොකරනු ඇත.

13.5 **යුතුකම්වලින් බැඳීම :** මෙම නියම හා කොන්දේසි, සේවා මට්ටම් ප්‍රමිතීන් සහ පරිශීලක මාර්ගෝපදේශය යටතේ වන ගනුදෙනුකරු සතු යුතුකම් වලංගු, බැඳීමට ලක්වන සහ බලාත්මක කළ හැකි යුතුකම් වේ.

13.6 **නැවත නැවත සිදුවීම:** 13.1 වන වගන්තියේ සිට 13.5 වන වගන්තිය දක්වා වන වගන්තිවල ඇති එක් එක් ඉදිරිපත් කිරීම් සහ සහතික කිරීම් මෙම නියම හා කොන්දේසිවල දිනයේ දී නිවැරදි වන අතර උපදෙසක් ගනුදෙනුකරු විසින් භාරදෙන එක් එක් දිනයේ දී එවිට පවතින අවස්ථානුගත කරුණුවලට අනුව නැවත නැවත සිදුවන්නාක් මෙන් එම එක් එක් ඉදිරිපත් කිරීම් සහ සහතික කිරීම් නිවැරදි වනු ඇති අතර ඒවාට අනුකූලව කටයුතු කරනු ඇත.

14. කාලසීමාව සහ අවසන් කිරීම

14.1 කාල සීමාව : මෙහි ප්‍රදානය කරනු ලබන සේවාවන් සහ අයිතිවාසිකම් මෙම නියම හා කොන්දේසිවල පළමු පිටුවේ දක්වා ඇති දිනයක සිට බලාත්මක වී, එහි නියම ප්‍රකාරව අවසන් විය යුතු ය.

14.2 අවසන් කිරීම : මෙම නියම හා කොන්දේසිවල කුමක් සඳහන් වුව ද, පහත දැක්වෙන පරිදි මෙම සේවාවන් අවසන් කළ හැකි ය:-

14.2.1 මෙහි පාර්ශ්වයන්ගේ යුතුකම් ඉටුකිරීම ගින්න, ගංවතුර, යුද්ධය, අනතුරු, වසංගත උවදුරක් හෝ යම් වෙනත් අදිසි බලපෑමෙන් සිදුවන ක්‍රියා හෝ යම් පාර්ශ්වයක පාලනයෙන් තොර සිද්ධීන් යන හේතුවක් මගින් වලක්වා ඇති අවස්ථාවක දී වැඩකරන දින පහකට (5) නොඅඩු අවසන් කිරීම පිළිබඳ ලිඛිත දැන්වීමක් පාර්ශ්ව දෙකක් අතුරින් එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත ලබා දෙමින් එම පාර්ශ්වය විසින්;

14.2.2 පාර්ශ්ව දෙකක් අතුරින් එක් පාර්ශ්වයන් විසින් අනෙක් පාර්ශ්වය වෙත දින තිහකට (30) නොඅඩු අවසන් කිරීම පිළිබඳ ලිඛිත දැන්වීමක් ලබා දෙමින් එම පාර්ශ්වය විසින්;

14.2.3 (i) ස්වකීය පූර්ණ අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන ගනුදෙනුකරුගේ මූල්‍ය කොන්දේසිවල යම් සැලකියයුතු අහිතකර වෙනසක් වුවහොත්, හෝ

(ii) මෙම නියම කොන්දේසි, සේවා මට්ටම් ප්‍රමිතීන්, ගිවිසුම් මැන්ඩේට් පත්‍රයක්, සේවා ගිවිසුමක් සහ පරිශීලක මාර්ගෝපදේශය යටතේ ගනුදෙනුකරුගේ යුතුකම් සම්බන්ධයෙන් වන යම් කරුණකට අනුකූලව කටයුතු කිරීමට ගණුදෙනුකරු අපොහොසත් වුවහොත්,

එවැනි අවස්ථාවක දී වහාම බැංකුව විසින්;

14.2.4 බැංකුව හෝ ගනුදෙනුකරු විසින් මෙම නියම හා කොන්දේසි යටතේ එහි යුතුකම් ඉටුකිරීම හෝ ඒවාට අනුකූලව කටයුතු කිරීම අදාල වන යම් ලිඛිත නීතියකට හෝ විධානයකට පටහැනි වන අවස්ථාවකදී, ස්වයංක්‍රීයවම;

14.2.5 සියලු ගිණුම් වසා දැමීමට පසුව ස්වයංක්‍රීයවම; හෝ

14.2.6 යම් ක්‍රියාවක් හෝ යම් දෙයක් සිදු කිරීම හෝ සිදු නොකිරීම යම් අදාල නීතියකට හෝ විධානයකට පටහැනි වන්නා වූ සහ පද්ධතියට හෝ බැංකුව විසින් ගනුදෙනුකරු වෙත

සහ/ හෝ යම් බලයලත් පරිශීලකයකු වෙත සේවාවන් සැපයීම සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපෑ හැකි යම් ක්‍රියාවක් හෝ දෙයක් ගනුදෙනුකරු සහ/ හෝ යම් බලයලත් පරිශීලකයකු විසින් සිදු කරන හෝ සිදු නොකරන අවස්ථාවක දී, ස්වයංක්‍රීයවම.

14.3 **හිමිවියයුතු අයිතිවාසිකම් සහ වගකීම් බලපෑමට ලක් නොවීම:** (කවර ආකාරයෙන් හෝ සිදුවුණ) මෙම සේවාවන් අවසන් කිරීම, කවර හෝ පාර්ශ්වයක යම් හිමිවියයුතු අයිතිවාසිකමකට හෝ වගකීමකට බලපානු නොලැබිය යුතු අතර එම අවසන් කිරීමේ දී හෝ එම අවසන් කිරීමට පසුව ප්‍රකාශිතව හෝ ව්‍යංගව බලාත්මක වීමට ඇති හෝ අඛණ්ඩව බලාත්මක වන මෙම නියම හා කොන්දේසිවල යම් විධිවිධානයක් බලාත්මක වීම හෝ අඛණ්ඩව බලාත්මක වීම සම්බන්ධයෙන් ද බලපානු නොලැබිය යුතු ය.

15. පැවරීම

සේවා මට්ටම් ප්‍රමිතීන් සමඟ මෙම නියම හා කොනන්දේසි යටතේ බැංකුව සතු යුතුකම් බැංකුවේ උපආයතනයක්, අනුබද්ධිත ආයතනයක් හෝ ගිවිසුම්කරුවන් වෙත පැවරිය හැකි හෝ ඔවුන් විසින් ඉටුකළ හැකි නම් හැර, කිසිදු පාර්ශවයක් විසින් අනෙක් පාර්ශ්වයේ පූර්ව ලිඛිත කැමැත්ත නොමැතිව, සේවා මට්ටම් ප්‍රමිතීන් සමඟ මෙම නියම හා කොන්දේසි යටතේ වන එම පාර්ශ්වයේ අයිතිවාසිකම් හෝ යුතුකම් පැවරීම හෝ මාරු කිරීම නොකළ යුතු ය. එම විස්තරය, පැවරීම හෝ මාරුකිරීම හේතුවෙන් ගනුදෙනුකරුගේ අයිතිවාසිකම් අඩු කරනු ලබන අවස්ථාවක දී, බැංකුව විසින් ගනුදෙනුකරුගේ පූර්ව ලිඛිත අවසරය ලබාගත යුතු ය.

16. සංශෝධනය කිරීම

16.1 මෙම නියම හා කොන්දේසි සංශෝධනය කිරීම: බැංකුවේ වෙබ් අඩවියෙහි පළ කළ යුතු දැනුම්දීමක් සිදු කර, 3.1 වන වගන්තියට යටත්ව (පද්ධතිය භාවිත කිරීමේ අයිතිය සම්බන්ධයෙන් වන ගාස්තුව සහ පිහිටුවීමේ ගාස්තුව) ස්වකීය පරම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක මෙම නියම හා කොන්දේසි කිසිවක් සංශෝධනය කිරීමට, ඒවාට යමක් එකතු කිරීමට හෝ වෙනස් කිරීමට බැංකුවට හිමිකම තිබිය යුතු අතර එම සංශෝධනයෙන්, එකතු කිරීමෙන් හෝ වෙනස් කිරීමෙන් ගනුදෙනුකරු බැඳීසිටිය යුතු ය.

16.2 පරිශීලක මාර්ගෝපදේශය සංශෝධනය කිරීම: බැංකුව විසින් පරිශීලක මාර්ගෝපදේශය සංශෝධනය කිරීම, එයට යමක් එකතු කිරීම, යළි ප්‍රකාශ කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කළ හැකි අතර එසේ පරිශීලක මාර්ගෝපදේශයට කරන ලද සංශෝධනය, එකතු කිරීම, යළි ප්‍රකාශ කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම පිළිබඳව Neos Corporate ප්‍රවේශවීමේ පිටුවෙහි බැනරයක් වශයෙන් ගනුදෙනුකරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

16.3 බැංකුව විසින් Neos Corporate භාවිත කිරීම හා සම්බන්ධිත වරප්‍රසාද තීරණය කළ යුතු අතර මෙම වරප්‍රසාද සහ ඒවාට සම්බන්ධිත කොන්දේසි වෙනස් කිරීම, මද වශයෙන් වෙනස් කිරීම, එකතු කිරීම හෝ සංශෝධනය කිරීම, ඒවා බැංකුවේ වෙබ් අඩවියෙහි පලකිරීම මගින් සිදු කිරීමේ පරම අභිමතය බැංකුව සතුවිය යුතු ය.

16.4. බැංකුව විසින් ගනුදෙනුකරුගේ නමින් විවෘත කරන ලද යම් ගිණුමක්/ ගිණුම් යෙදුමට පසුව ඇමිණීම හෝ වෙන්කිරීම කරනු ලැබිය යුතු ය. එම ඇමිණීම් හෝ වෙන්කිරීම් බැංකුවේ පවතින රීති සහ නියෝග හේතුවෙන් සිදු වියහැකි බවට ගනුදෙනුකරු එකඟව, පිළිගෙන සිටිනු ලැබිය යුතු ය.

16.5 බැංකුව විසින් කලින් කල සේවාවන් සඳහා අලුත් පහසුකම්/ තෝරාගැනීමේ අවස්ථාවන් හඳුන්වාදෙනු ලැබිය යුතු ය. බැංකුවේ වෙබ් අඩවියෙහි පල කිරීම මගින් ගනුදෙනුකරුට දැනුම් දෙනු ලැබිය යුතු එම සේවාවන්ට අදාල වන නියම හා කොන්දේසි මගින් බැඳී සිටීමට ගනුදෙනුකරු මෙයින් එකඟව සිටිනු ලැබේ. එම නියම හා කොන්දේසිවලට එකඟ වන්නේ නම් ගනුදෙනුකරු විසින් එම සේවාවන් භාවිත කිරීම සඳහා ලියාපදිංචි විය හැකි ය.

16.6 Neos Corporate භාවිත කිරීම Neos Corporate මගින් හෝ අන්‍යාකාරයෙන් ආවරණය වන සියලු සේවාවන්, පහසුකම් සහ ගනුදෙනු පාලනය කරන්නා වූ බැංකුවේ පවතින ව්‍යවස්ථාවලින්, කොන්දේසි, රීති, නියෝග සහ යම් නියම හා කොන්දේසි යනාදියට යටත් විය යුතු ය.

17. විවිධ

17.1 කඩ කිරීම පිළිබඳ සහ බුද්ධිමය දේපළ සම්බන්ධ උල්ලංඝනය කිරීම් පිළිබඳ නිවේදනය: ගනුදෙනුකරු විසින් හෝ බලයලත් පරිශීලකයකු විසින් හෝ තෙවන පාර්ශ්වයක් විසින් මෙම නියම හා කොන්දේසි කඩකිරීමක් පිළිබඳව හෝ මෙම නියම හා කොන්දේසිවල සඳහන් බැංකුව සතු බුද්ධිමය දේපළ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳව ගනුදෙනුකරු දැනගත්තේ නම් හෝ එවැනි කඩකිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් පිළිබඳව සැක කිරීමට ගනුදෙනුකරුට හේතු පවතීනම් ඒ පිළිබඳව හෝ පද්ධතිය හෝ සේවාවක් මගින් තෙවන පාර්ශ්වයක අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට වන යම් චෝදනාවක් පිළිබඳව වහාම ගනුදෙනුකරු විසින් බැංකුවට දැනුම්දිය යුතු ය.

17.2 සම්පූර්ණ ගිවිසුම: ඉල්ලුම්පත්‍රය සමග මෙම නියම හා කොන්දේසි, Neos Corporate යෝජනා සම්මතය, සේවා මට්ටම් ප්‍රමිතීන්, Neos Corporate ප්‍රොෆයිලය සංශෝධනය කිරීමේ ආකෘතිපත්‍රය (තිබේ නම්), පවත්නා පරිශීලකයන් (සිටී නම්) සඳහා වන

Neos Corporate ගිණුම එකතු කිරීම/ මකා දැමීම සඳහා වන ආකෘතිපත්‍රය, පරිශීලක මාර්ගෝපදේශය, ගිණුම් මැන්ඩේට්පත්‍ර, පහසුකම් ගිවිසුම් සහ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි ගිවිසුමක් මගින් හෝ අන්‍යාකාරයෙන් බැහැර කළ හැකි, නීතිය මගින් ගම්‍ය වන වෙනත් නියම බැහැර කිරීම සඳහා මෙහි සඳහන් දිනයේ දී ගිවිසුමේ විෂය කරුණු සම්බන්ධයෙන් ගනුදෙනුකරු සහ බැංකුව අතර වන සම්පූර්ණ ගිවිසුම (ගිවිසුම) සංස්ථාපනය කරනු ලබන අතර එම සම්පූර්ණ ගිවිසුම මෙම නියම හා කොන්දේසිවල විෂය කරුණු සම්බන්ධයෙන් ගනුදෙනුකරු සහ බැංකුව අතර ඇති වූ යම් පූර්ව ලිඛිත හෝ වාචික ගිවිසුම් අභිබවා බලාත්මක වේ. මෙම ගිවිසුමට ප්‍රකාශිතව ඇතුළත් නොකරන ලද යම් ඉදිරිපත් කිරීමක්, සහතික කිරීමක් හෝ කටයුත්තක් මගින් මෙම ගිවිසුමට එළඹීම සඳහා පෙළඹවීමක් සිදු නොවූ බවට ගනුදෙනුකරු පිළිගෙන සිටියි. නීතියෙන් අවසර ලබාදෙන තාක්දුරට සහ වංචනික සිදුවීමක දී හැර, මෙම ගිවිසුම සම්බන්ධයෙන් කරන ලද හෝ ලබාදෙන ලද යම් ඉදිරිපත් කිරීමක්, සහතික කිරීමක් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් වන ගනුදෙනුකරුගේ අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම (තෝරතවල හෝ ව්‍යවස්ථාව යටතේ හටගන්නා අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම ඇතුළුව) ගනුදෙනුකරුගේ වෙනත් සියලු අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම බැහැරවන පරිදි මෙම ගිවිසුමේ නියම කඩකිරීම සඳහා පමණක් විය යුතු බවට ගනුදෙනුකරු විසින් එකඟව, පිළිගෙන සිටිනු ලබයි.

17.3 ගැටීම් සහ අනනුකූලතාවයන් : මෙම නියම හා කොන්දේසි, සේවා මට්ටම් ප්‍රමිතීන්, ඉල්ලුම්පත්‍රය, Neos Corporate ප්‍රොෆයිලය සංශෝධනය කිරීමේ ආකෘතිපත්‍රය (තිබේ නම්) පවත්නා පරිශීලකයන් සඳහා (සිටී නම්) Neos Corporate ගිණුම එකතු කිරීම/ මකා දැමීම සඳහා වන ආකෘතිපත්‍රය (තිබේ නම්), පරිශීලක මාර්ගෝපදේශය, ගිණුම් මැන්ඩේට් පත්‍රය, පහසුකම් ගිවිසුම, සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි අතරෙහි සහ ඒවා අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවයක් ඇති අවස්ථාවක දී, ප්‍රමුඛතාවය පහත දැක්වෙන ප්‍රමුඛතාවයේ අවරෝහණ අනුපිළිවෙල අනුව ලබා දිය යුතු ය:

17.3.1 මෙම නියම හා කොන්දේසි සහ සේවා මට්ටම් ප්‍රමිතීන්;

17.3.2 ගිණුම් මැන්ඩේට්පත්‍ර සහ පහසුකම් ගිවිසුම්;

17.3.3 ඉල්ලුම් පත්‍රය, Neos Corporate ප්‍රොෆයිල සංශෝධනය කිරීමේ ආකෘතිපත්‍රය පවත්නා පරිශීලකයන් සඳහා Neos Corporate ගිණුම එකතු කිරීම/ මකා දැමීම සඳහා වන ආකෘති පත්‍රය

17.3.4 සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි; සහ

17.3.5 පරිශීලක මාර්ගෝපදේශය;

තව ද, ඉහත ලැයිස්තුගත කර ඇති එම වෙනත් ලේඛනවලින් කිසිවක් පිළිබඳව මෙම නියම හා කොන්දේසිවල ඇති යම් සඳහන් කිරීම්, කලින් කල සංශෝධනය කරනු ලබන, එකතු කරනු ලබන, අලුත් කරනු ලබන, යළි ප්‍රකාශ කරනු ලබන හෝ ප්‍රතියෝජනය කරනු ලබන පරිදි එම ලේඛනවල කරන ලද සඳහනක් වශයෙන් මෙම නියම හා කොන්දේසි පුරාවටම අවබෝධ කරගනු ලැබිය යුතු ය.

17.4 **අර්ධ වශයෙන් අවලංගු වීම**: මෙම නියම හා කොන්දේසිවල විධිවිධාන, සේවා මට්ටම් ප්‍රමිතීන් හෝ පරිශීලක මාර්ගෝපදේශ අදාල නීති සහ විධානවලට යටත් විය යුතු අතර එම නීති හාා විධිවිධාන මගින් අවසර දී ඇතිතාක් දුරට අදාල විය යුතු ය. එමෙන්ම යම් අධිකරණ බලප්‍රදේශයක නීතිය යටතේ මෙම නියම හා කොන්දේසිවල, විධිවිධාන, සේවා මට්ටම් ප්‍රමිතීන්වල පරිශීලක මාර්ගෝපදේශයේ යම් විධිවිධානයක නීතිවිරෝධී බව, අවලංගුභාවය හෝ බලාත්මක කළ නොහැකි බව වෙනත් අධිකරණ බලප්‍රදේශයක නීතිය යටතේ එහි නීත්‍යානුකූලබව, වලංගුභාවය හෝ බලාත්මක කළ හැකි බව සම්බන්ධයෙන් හෝ වෙනත් විධිවිධානයක නීත්‍යානුකූල බව, වලංගුභාවය හෝ බලාත්මක කළ හැකි බව සම්බන්ධයෙන් බලපානු නොලබයි.

17.5 **මාතෘකා පරිශීලනය සඳහා පමණක් වීම**: මෙම නියම හා කොන්දේසිවල මාතෘකා පරිශීලනයේ පහසුව සඳහා පමණක් වන අතර මෙම නියම හා කොන්දේසි අර්ථ නිරූපණය කිරීම හෝ අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් එම මාතෘකා කිසිදු ආකාරයකින් බලපානු නොලැබිය යුතු ය.

17.6 **ව්‍යංග්‍ය නියම බැහැර කිරීම :** නීතියෙන් හෝ චාරිත්‍රයකින් ගම්‍ය වන හෝ පාර්ශ්වයන් අතර එකඟ වූ වෙනත් නියම හෝ කොන්දේසිවලින් හෝ පාර්ශ්වයන් විසින් එළඹී ඇති බන්ධනීය ලිඛිත නීත්‍යානුකූල ගිවිසුමක අන්තර්ගත නොවන යම් ඉදිරිපත් කිරීමකින් අන්‍යාකාරයෙන් ඇති වෙමින් ගම්‍ය වන යම් සහතික කිරීමක්, කොන්දේසියක් හෝ වෙනත් කටයුත්තක් මෙම නියම හා කොන්දේසි සහ සේවා මට්ටම් ප්‍රමිතීන් මගින් ප්‍රකාශිතවම බැහැර කළ යුතු ය. එසේ බැහැර කරන ලද යම් සහතික කිරීමක්, කොන්දේසියක්, කටයුත්තක්, ගිවිසුමක් හෝ ඉදිරිපත් කිරීමක් මත විශ්වාස තබා පාර්ශ්වයන් විසින් මෙම නියම හා කොන්දේසිවලට ඇතුළත් නොවූ බව සහ/හෝ මෙම නියම හා කොන්දේසි පිළිනොගන්නා ලද බව පාර්ශ්වයන් විසින් පිළිගෙන තහවුරු කර සිටියි.

17.7 **දැන්වීම්:** සේවා මට්ටම් ප්‍රමිතීන් සමඟ මෙම නියම හා කොන්දේසි සම්බන්ධයෙන් ගනුදෙනුකරු හෝ බැංකුව විසින් ලබාදීමට නියමිත යම් නිවේදනයක් (ඉලෙක්ට්‍රොනිකව යවන්නේ නම් මිස) ලිඛිත විය යුතු අතර අදාළ ඉල්ලුම්පත්‍රයේ හෝ නවතම ප්‍රොෆයිලය

සංශෝධනය කිරීම සඳහා වන ආකෘති පත්‍රයේ දක්වා ඇති (අවස්ථාවෝචිත පරිදි) අදාළ පාර්ශ්වයේ ලිපිනයට (විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත්ව) හෝ ෆැක්ස් අංකයට යැවිය යුතු ය. අන්‍යාකාරයෙන් එකඟ වී ඇත්නම් මිස, සියලු දැන්වීම් ඉංග්‍රීසි භාෂාවෙන් විය යුතු ය.

17.8 **නියම හා කොන්දේසි අතීතයට බලපාන පරිදි අදාළ වන බව:** මෙම නියම හා කොන්දේසිවල විස්තර කර ඇති ඉලෙක්ට්‍රොනික මූල්‍ය සේවාවන් පිළිබඳ විධිවිධානවලට අදාළව ගනුදෙනුකරු සහ බැංකුව විසින් යම් පියවර ගෙන ඇති අවස්ථාවක දී, අදාළ අවස්ථාවේ දී මෙම නියම හා කොන්දේසිවලට එළඹී නොතිබුණ ද, මෙම නියම හා කොන්දේසි මගින් එම සේවාවන්ගේ විධිවිධාන පාලනය වනු ඇති බවට එකඟ ව සිටී.

18. **පාලනය වන නීතිය සහ අධිකරණ බලය:**

18.1 **නීතිය තෝරා ගැනීම**: මෙම නියම හා කොන්දේසි ඇතුළුව ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති ප්‍රකාරව අවබෝධ කරගනු ලැබිය යුතු ය. මෙම නියම හා කොන්දේසි හෝ ඒවායෙහි යම් සංශෝධනයක් හෝ ඒවාට යමක් එකතු කිරීමක් ඇතුළත් ව ගිවිසුම තුළින් හෝ ගිවිසුම සම්බන්ධයෙන් හටගන්නා යම් ආරවුලක් එම කාර්යය සඳහා ශ්‍රී ලංකා අධිකරණවල අනන්‍ය අධිකරණ බලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

19. **විමසීම්, පැමිණිලි සහ ආරවුල් නිරවුල්කරණය කිරීම**

19.1 Neos Corporate සේවාව භාවිත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුට යම් පැමිණිල්ලක් හෝ විමසීමක් ඇති අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින් 0094 112 448888 යන අංකයෙන් බැංකුවේ පැය 24ම ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඇමතිය යුතු ය. නැතහොත් බැංකු ශාඛාවකට පිවිසිය යුතු ය. පැමිණිල්ල නොවිසඳුණු අවස්ථාවකදී ගනුදෙනුකරු විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හෝ ශ්‍රී ලංකා මහබැංකුව මගින් පිළිසරණ ඉල්ලා සිටිය හැකි ය.

19.2 ගනුදෙනුකරුට දැනගැනීමට ලැබුණු ගනුදෙනුවල සිදුවූ යම් දෝෂයක්, විෂමතාවක් හෝ නොකර හැරීමක් පිළිබඳව ගනුදෙනුකරු විසින් ප්‍රකාශයේ දින සිට දින 14ක් ඇතුළත බැංකුවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

20. ගනුදෙනුකරුගේ ප්‍රකාශය

20.1 (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය** විසින් මා හට Neos Corporate පහසුකම ලබාදෙන ලෙස වන මාගේ ඉල්ලීම පිළිගැනීමට එකඟවීම සැලකිල්ලට ගනිමින්, මෙම නියම හා කොන්දේසි මා විසින් පැහැදිලි කරගෙන, අවබෝධ කරගෙන, පිළිගන්නා ලද බවට මෙයින් එකඟව සිටිනු ලැබේ. බැංකුවේ Neos Corporate සේවාවන් පාලනය වන්නාවූ සියලු නියම හා කොන්දේසිවලින් බැඳී සිටීමට මා විසින් එකඟව සිටිනු ලැබේ. බැංකුව විසින් ලබා දෙන

ලද ආරක්ෂක සහ ආරක්ෂණ උපදෙස්වලට අනුකූලව මා කටයුතු නොකළහොත්, සිදුවන අවදානම සම්පූර්ණයෙන්ම මා විසින් භාරගත යුතු බවට මම ප්‍රකාශ කර සිටිමි. තව ද, බැංකුව විසින් මාගේ ඉල්ලීම පිළිගැනීම සම්බන්ධයෙන් හෝ එසේ කිරීමෙන් හටගන්නා සියලු නඩුකර, කාර්යපටිපාටින්, වගකීම්, හිමිකම්පෑම්, නඩු, අලාභ, පිරිවැය සහ වියදම්වලට එරෙහිව බැංකුව හානිපූරණය කර තැබීමට මා විසින් එකඟව සිටිනු ලැබේ. යම් තැනැත්තකු විසින් පරිශීලක අනන්‍යතාවය සහ මුරපදය අනවසරයෙන් භාවිත කිරීමක් හෝ අනවසරයෙන් භාවිත කිරීමට උත්සාහ දැරීමක් පිළිබඳව හෝ Neos Corporate UB යතුරට/මෘදුකාංග ටෝකනයට අනවසරයෙන් ප්‍රවේශ වීමක් හෝ ප්‍රවේශ වීමට උත්සාහ දැරීමක් පිළිබඳව මා හට දැනගැනීමට ලැබුණහොත් ඒ පිළිබඳව මා විසින් වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු බවට මම සහතික කර සිටිමි.

20.2 වෙනත් බැංකුවලින්, ණය තොරතුරු කාර්යාංශයෙන් (CRIB) හෝ ගිණුම (ගිණුම්) සම්බන්ධ තොරතුරු ලබාගැනීම සඳහා නීත්‍යානුකූලව බලය පැවරී ඇති වෙනත් යම් අධිකාරියකින් ලැබෙන යම් සහ සියලු විමසීම් සඳහා මාගෙන් විමසීමෙන් තොරව, බැංකුව විසින් තීරණය කරන ආකාරයකට ප්‍රතිචාර දැක්වීමට සහ සැලසීමට මා විසින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. සැක දුරු කිරීම සඳහා එවැනි ප්‍රතිචාරයක බැංකු යොමුවක් ඇතුළත් කළ හැකි ය.

20.3 Neos Corporate සේවාව සම්බන්ධයෙන් වන ඉහත සඳහන් නියම හා කොන්දේසි මා විසින් කියවා, අවබෝධ කරගෙන, ඒවායින් බැඳී සිටීමට එකග වන බවට මා විසින් මෙයින් සහතික කර සිටිනු ලැබේ.

1. එක් අධ්‍යක්ෂවරයකු සිටින සමාගම

....	....
අධ්‍යක්ෂවරයා කාවද්දන ලද සමාගමේ නිල මුද්‍රාව (තිබේ නම්)	සමාගම් ලේකම්වරයා කාවද්දන ලද සමාගමේ නිලමුද්‍රාව (තිබේ නම්)
....	....
නම සහ ජාතික හැඳුනුම්පත් අංකය	නම සහ ජාතික හැඳුනුම්පත් අංකය
....	....
සාක්ෂි දරනු ලැබුවේ	සාක්ෂි දරනු ලැබුවේ
....	....

නම සහ ජාතික හැඳුනුම්පත් අංකය

නම සහ ජාතික හැඳුනුම්පත් අංකය

....
දිනය

....
දිනය

2. එක් අධ්‍යක්ෂකවරයකුට වඩා සිටින සමාගම

....
අධ්‍යක්ෂවරයා
කාවද්දන ලද සමාගමේ නිල මුද්‍රාව
(තිබේ නම්)

....
අධ්‍යක්ෂවරයා
කාවද්දන ලද සමාගමේ නිල මුද්‍රාව
(තිබේ නම්)

....
නම සහ ජාතික හැඳුනුම්පත් අංකය

....
නම සහ ජාතික හැඳුනුම්පත් අංකය

....
සාක්ෂි දරනු ලැබුවේ

....
සාක්ෂි දරනු ලැබුවේ

....
දිනය

....
දිනය

....
නම සහ ජාතික හැඳුනුම්පත් අංකය

....
නම සහ ජාතික හැඳුනුම්පත් අංකය